සංගීතය (පෙරදිග)

09 ශ්‍රේණිය

කාර්ය පත්‍රිකා සංග්‍රහය

කලාප අධ්‍යාපන කාර්යාලය

අම්පාර

පටුන

	පිටුව
1. මව්පිය ගුණ වරුණ ගී	1 - 2
2. බිලාවල් , භූපාලි , කාෆි රාග විස්තර සහ ස්වර අභ්‍යාස	3 - 6
3. මේලය , ජාතිය , රාග , වාදී , සංවාදී , අනුවාදී , විවාදී හා වර්ජිත ස්වර	7 - 10
4. ආරෝහණ , අවරෝහණ හා මුඛ්‍යාංගය	11 - 12
5. බිලාවල් , භූපාලි රාගයන්ට අයත් ලක්ෂණ ගීත	13 - 14
6. විදුලි ඕගනයේ මුලිකාංග	15 - 16
7. එකෝඩියන් භාණ්ඩයේ ස්වර පිහිටීම	17 - 18
8. ගිටාරයේ ස්වර පිහිටන අයුරු	19 - 21
9. ගිටාරයේ C D E Minor Chords සහ D G A Major Chords වාදනය	22 - 25
10. කණ්ඩායම් ගීත	26 - 28
11. මාත්‍රා කැටි මිශ්‍ර වූ හින්දුස්ථානී සහ දේශීය තාල පද ප්‍රායෝගිකව අධ්‍යයනය	29 - 30
12. අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය	31 - 34
13. Sharp , Flat , Natural Marks	35 - 36
14. Clef , Rest Mark , Tie Mark	37 - 38
15. F , G , C , B^b Scals (Major and Minor)	39 - 42
16. Time Signature	43 - 44
17. Key Signature	45 - 46
18. නව නාට්‍ය ගීත ශෛලියේ ස්වභාවය	47 - 50
19. වන්නම් ගී	51 - 54
20. ප්‍රශස්ති ගී	55 - 58
21. හටන් ගී	59 - 60
22. පංචතූර්ය වාදනය	61 - 64
23. සංගීත ප්‍රසංගයකදී භාවිතා කරන තාක්ෂණික මෙවලම්	65 - 68

විෂය:- පෙරදිග සංගීතය ශ්‍රේණිය:- 09

පාඩම/ඒකකය:- මව් පිය ගුණ වරුණ ගී

ගුරුවරයාගේ නම:- ඩබ්.එම්.ඉනෝකා උදයංගනි වනසිංහ පාසල:- අම්/ මංගලාරාම මහ විදුහල

මව් පිය ගුණ වරුණ ගී

- ශ්‍රී ලංකා සරල ගී ක්ෂේත්‍රය තුළ මවුපිය ගුණ වර්ණනා ඇතුළත් සිංහල ගී රාශියක් ඇත. මේවා ග්‍රැමෆෝන් තැටි ගී යුගයේ සිට බිහිවී ඇත.
- ග්‍රැමෆෝන් තැටි යුගයේ ජනප්‍රිය වූ ගීත ලෙස එච්. ඩබ්ලියු .රූපසිංහ සහ කෝකිලදේවි විසින් ගයන ලද "මව්පිය ආදී සොඳුරු තමාගේ" ගීතයත් රුක්මණී දේවි මහත්මිය විසින් ගයන ලද ''දැඩි කළ මාතා පෙම්බර මාතා'' යන ගීතයත් පෙන්වාදිය හැක.
- ඉතා සරල නාද මාලාවකින් යුතු මෙම ගීතයන්හි හැඟීම් තීව්‍ර වන්නේ එම ගීතයේ නාද මාලාව, සංගීත නිර්මාණය මෙන්ම ගීතය ගයන ගායකයා ගේ හෝ ගායිකාවගේ සුමධුර වූ ගායන රටාව නිසාය. ඔබ අසා ඇති ගීත කීපයක් පහතින් දැක්වේ.

ගීතය	ගායනය	සංගීතය	පද රචනය
අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී	ටී එම් ජයරත්න	රෝහණ වීරසිංහ	මාලනී ජයරත්න
සියක් ආයු ලැබ මගෙත් ආයු ගෙන	ටී එම් ජයරත්න	එච් එම් ජයවර්ධන	රඹුකන සිද්ධාර්ථ හිමි
ආදරයේ උල්පත වූ අම්මා	වික්ටර් රත්නායක	වික්ටර් රත්නායක	ප්‍රේමකීර්ති ද අල්විස්
දුනුකෙයියා මලක් වගේ	සුජාතා අත්තනායක	වී.හේමපාල පෙරේරා	ප්‍රේමකීර්ති ද අල්විස්

මේ අතරින් එක් ගීතයක් බලමු

ආදරයේ උල්පත වූ අම්මා -මා ඔබගේ පුතු වූ
ඔබ මතු බුදුවන දවසේ - මා රාහුල කුමරුන් සේ
සෙවණ පතා අද මෙන් පැමිණෙන්නෙමි- සුළැඟිල්ලේ එල්ලී ....

සඳ දියකොට කිරි වතුරෙන්- ඒ දියරෙන් මූව දෝවා
දිව මතුරක්වන් නැළැවිලි ගීයෙන්-මතකයි මා නැළැවූවා
ජීවිතයෙන් ජීවිතයක් ගෙන දී - ඒ ජීවිතයට දිරි දී පණ දීමා දැඩිකල අම්මා ......

තුරුලට ගෙන අත් පා හැඩ ගස්වානිදි ගන්වා යහන් ගැබේ....
සිහිනෙන් ගැ මුදු සුවඳක් මෙන් -සිහිවෙයි ඒ කිරි සුවඳ ඔබේ
දවසින් දවසට සෙනෙහස ළබැඳී-ගෙන දී දිවියට නව පණ ලැබ දීමා දැඩි කල අම්මා .....

වික්ටර් රත්නායක මහතා විසින් ගායනා කරන ලද මෙම ගීතය ප්‍රේමකීර්ති ද අල්විස් මහතාගේ පෞද්ගලික අත් දැකීමක් ඇසුරින් රචිත පළමු මව් ගුණ ගීතය යි .

මෙම ගීතය ලෝකය බිහිකල අම්මාගේ නැළවිලි ගීය පදනම් කරගත් ස්වර පද්ධතියකට අනුව මෙහි තනුව නිර්මාණය කර ඇත .මව තම දරුවකු ඇති දැඩි කරන අයුරුත්, මව හා දරුවා අතර පවතින අසීමිත සෙනෙහසත් මෙම ගීතයේ පදමාලාව තුළින් ඉතා පැහැදිලිව ඇත .

ගායකයාගේ නැවුම් මිහිරි ගායන විලාසයත්,හැඟීම් උපදවන කටහඬත් නිසා ,පදමාලාවේ අර්ථය තවත් වැඩි වී ඇත .

එහි අතුරු වාදන සංගීත ඛණ්ඩ හා ගායනයේ පසුබිමින් ඇසෙන නාද සමූහය නැළවිලි ගී ආශ්‍රිතව සකස් කර ඇත .

කාර්ය පත්‍රිකාව.

❖ **පහත සඳහන් වාක්‍යයන්හි හිස්තැනට සුදුසු වචනය ලියන්න.**

1.දුනුකෙයියා මලක් වගේ ගීතය... විසින් ගයනු ලැබේ.

2. සරල ගීයක පළමු කොටස............................හා දෙවන කොටස...............................වෙයි .

3.රඹුකන සිද්ධාර්ථ හිමියන් විසින් රචිත ගීයක් වන්නේ..ය.

4.ග්‍රැමෆෝන් තැටි යුගයේ ජනප්‍රිය වූ මවු ගුණ ගීයකි...

5."සියක් ආයු ලැබ" ගීතයේ...එච්.එම් ජයවර්ධන මහතා විසින් සිදුකර ඇත.

❖ **පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.**

6.ඉහත ගීතයේ මතු බුදු වන ලෙස අදහස් වන්නේ කවුරුන්ද ?.

i.මව ය. ii.පියා ය. iii.පුතා ය iv.සොහොයුරා ය.

7.ගීතයක් හදවතට දැනෙන්නේ එම ගීතය ගයන ගායකයා හෝ ගායිකාවගේ,

i.සංගීතය නිසාය. ii.පද රචනය නිසාය. iii.ගායන රටාව නිසාය. iv. මෙම සියල්ල නිසාය.

8."ආදරයේ උල්පත වූ අම්මා" ගීතය ගැයෙන්නේ.

i. සම ග්‍රහයෙනි. ii. විෂම ග්‍රහයෙනි. iii. අව ග්‍රහයෙනි. iv. අනු තාලයෙනි.

9."සියක් ආයු ලැබ"ගීතය ගැයෙන්නේ,

i. සුළු මැදුම් දෙතිතටය. ii. මහ තනි තිතටය. iii. මැදුම් තනි තිතටය. iv. මැදුම් මහ දෙතිතටය.

10. " ආදරයේ උල්පත වූ අම්මා" ගීතය නිර්මාණය කරන ලද්දේ,

i. වික්ටර් රත්නායක මහතාය. ii.මාලනී ජයරත්න මහත්මිය.

iii.රෝහණ වීරසිංහ මහතාය. iv. ප්‍රේමකීර්ති ද අල්විස් මහතාය.

❖ පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

11.ඔබ අසා ඇති වෙනත් මව් ගුණ හෝ පිය ගුණ ගීතයක් ලියා එහි අර්ථය ඔබට හැඟෙන පරිදි ලියන්න .

12.මව් ගුණ හෝ පිය ගුණ ,පද්‍යය හතරකින් යුත් ගීතයක් නිර්මාණය කරන්න .

13.සරල ගීතයක කොටස් හඳුන්වන්න .

14."අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී" ගීතයේ පේලි දෙකක් පද ප්‍රස්තාර කරන්න.

15.ඔබ දන්නා වෙනත් මව්පිය ගුණ වරුණගීත 05 ක් නම් කරන්න .

විෂය:- පෙරදිග සංගීතය ශ්‍රේණිය;- 9

පාඩම/ඒකකය;- බිලාවල්,භූපාලි,කාෆි,රාග විස්තර සහ ස්වර අභ්‍යාස

ගුරුවරයාගේ නම - එස්. ඩී. දමිමි ප්‍රියංකා රාජපක්ෂ(කලාප අධ්‍යාපන කාර්යාලය)

- බිලාවල්, භූපාලි, කාෆි, යන නිර්දේශිත රාග තුනෙහි රාග විස්තර

රාගය	මේලය	ආරෝහණ අවරෝහණ	වාදී/සංවාදී	ජාතිය	මුඛ්‍යාංගය	ගානසමය
බිලාවල්	බිලාවල්	සරි,ගමප,ධනිසං සං,නිධප, මග,රිස	ධ / ග	සම්පූර්ණ	ගරිගප,ධනිසං	දිවා ප්‍රථම ප්‍රහරය
භූපාලි	කල්‍යාණ	සරිගප, ධසං සං, ධප, ග, රිස	ග / ධ	ඖඩව	ගරි,සධ,සරිග පග,ධපග,රිස	රාත්‍රී ප්‍රථම ප්‍රහරය
කාෆි	කාෆි	සරිග, මප, ධ, නිසං සං, නිධප, මග, රිස	ප / ස	සම්පූර්ණ	සස,රිරි,ගග, මම, ප	මධ්‍යම රාත්‍රිය

❖ රාගයක් ගොඩනැගී ඇත්තේ ස්වර සංගති ඇසුරිනි.

❖ රාගයක ස්වර යෙදෙන ආකාරය සහ රාග ස්වරූපය මෙන්ම මූලික වශයෙන් රාගය හඳුනාගැනීමට රාග සංගති උපකාරීවේ.

රාග සංගති

බිලාවල් රාගය:- සරිස, ගප මගමරිස, ගරිගප, ගපධනිස, සනිධප, ගපධප, පමගරිගප

භූපාලි රාගය :- සරිග, ස-ධප, සධ සරිග, ගපග, පධසරිග, ගපධසංධප, සං-ධපග

කාෆි රාගය :- රිගරිමගරිස, සරිග සරිප, සස රිරි ගග මම ප, රිනිධනි පධමප, නිසරිග, සරිප, ප-මපග-රි, මමපධනිනිසං

❖ නිවැරදිව ස්වර ගායනය හෝ වාදනය කිරීමේ හැකියාව ලැබීමට නම් ස්වර අභ්‍යාස පුහුණු කළ යුතුය.

❖ යම්කිසි රාගයකට අදාළව ගොඩනැගුණු ස්වර අභ්‍යාස මගින් එම රාගයේ ස්වර නිවැරදිව හැසිරවීමේ හැකියාව වර්ධනය වනු ඇත.

❖ ස්වර අභ්‍යාස ' පල්ටා' ලෙසද හඳුන්වයි.

❖ රාගයක භාවිත ශුද්ධ, කෝමල, තීව්‍ර, යන ස්වර විවිධාකාරයෙන් සංයෝග වීම මගින් රාග නිර්මාණය වේ.

❖ එම රාග වලට අනුව ස්වර සංගති යම්කිසි ක්‍රමානුකූල රටාවකට ගොඩනැගීම මගින් ස්වර අභ්‍යාස නිර්මාණය කරගතහැකි අතර, රාගධාරි සංගීතය හදාරන ආධුනිකයෙකු මෙම ස්වර අභ්‍යාස අනිවාර්යයෙන්ම පුහුණු කළ යුතුය.

ස්වර අභ්‍යාස :-

බිලාවල් රාගය-

1. සරිග- / රිගම- / ගමප- / මපධ- / පධනි- / ධනිසං- /
   සංනිධ- / නිධප- / ධපම- / පමග- / මගරි- / ගරිස- /

2. සරිස, සරිගරිස, සරිගමගරිස, සරිගමපමගරිස, සරිගමපධපමගරිස, සරිගමපධනිධපමගරිස, සරිගමපධනිසංනිධපමගරිස

3. සරිස ගප මගමරිස
ගපධප
ගපධනිධප
ගපධනිස්නිධප

4. සරිස
සරිගමප මගමරිස
සරිගමප ධප ගප මගමරිස
සරිගමප ධනිස්නිධප ගප මගමරිස

ඉහත ස්වර අභ්‍යාසය විස්තාරණය කළ විට

සරිස, ගප මගමරිස

සරිස, ගපධප මගමරිස

සරිස, ගපධනිධප මගමරිස

සරිස, ගපධනිස්නිධප මගමරිස

භූපාලි රාගය -

1.සධ්සරි ගරිගප ගරිස
ගරිගපධප
ගරිගපධස්ධප

2. සරිස
සරිගරිස
සරිගපගරිස
සරිගපධපගරිස
සරිගපධස්ධපගරිස

මෙම ස්වර අභ්‍යාසය විස්තාරණය කළ විට

සධ්සරි ගරිගප ගරිස
සධ්සරි ගරිගපධප ගරිස
සධ්සරි ගරිගපධස්ධප ගරිස

කාෆි රාගය -

1. රිගුමගු
රිගුමපමගු
රිගුමපධපමගු
රිගුමපධනිධපමගු
රිගුමපධනිස්නිධපමගු

2. සරිගු සරිප මප මගුරිස
සරිගු සරිප මපධප මගුරිස
සරිගු සරිප මපධනිධප මගුරිස
සරිගු සරිප මපධනිස්නිධප මගුරිස

3. රිගුරිමගුරිස රිගු මගු
රිගුමප
රිගුමපධප
රිගුමපධනිධප
රිගුමපධනිස්නිධප

රාගධාරී සංගීතය හැදෑරීමේදී රාගානුකූල ස්වර අභ්‍යාස ගායනය කරනු ලබන අතර ඉහත

දක්වා ඇත්තේ එවැනි නිර්දේශිත රාග 03 කට අදාළ ස්වර සංගති සහිත ස්වර අභ්‍යාසයන් කීපයකි. ගායනයේදී කටහඬ පුහුණුව සඳහා මෙන්ම වාදනයේදී හස්ත සාධනය සඳහා ස්වර අභ්‍යාස ගායනය වාදනය කරනු ලබන අතර එවන් ශුද්ධ ස්වර අභ්‍යාස කීපයක් පහත දැක්වේ.

- ගරිසරි ග - ග -/ මගරිග ම - ම -/ පමගම ප -ප-/ ධපමප ධ -ධ - / නිධපධ නි - නි -/ස̇නිධනි ස̇-ස̇- ධනිස̇නි ධ-ධ- / පධනිධ ප-ප- / මපධප ම-ම-/ ගමපම ග-ග-/ රිගමග රි-රි-/ සරිගරි ස-ස- /
- සරිසගරිස / රිගරිමගරි / ගමගපමග / මපමධපම /පධපනිධප /ධනිධස̇නිධ / නිස̇නිරි̇ස̇නි / ස̇රි̇ස̇ග̇රි̇ස̇
- ස̇නිස̇ධනිස̇ / නිධනිපධනි / ධපධමපධ /පමපගමප / මගමරිගම / ගරිගසරිග / රිසරිනි̣සරි / සනි̣සධ̣නි̣ස
- ගසරිග / මරිගම /පගමප / ධමපධ / නිපධනි / ස̇ධනිස̇ / ධස̇නිධ / පනිධප /මධපම / ගපමග / රිමගරි / සගරිස

නිවැරදි පිළිතුර තෝරන්න

1. බිලාවල් සහ භූපාලි රාග වල

   i. කෝමල ස්වර යෙදේ ii. ශුද්ධ ස්වර යෙදේ iii. ශුද්ධ සහ කෝමල ස්වර යෙදේ

   iv. ශුද්ධ හා තීව්‍ර ස්වර යෙදේ

2. රාගධාරී සංගීතය හදාරන්නෙකු මූලිකවම පුහුණු වියයුතු අංගයකි

   i. මධ්‍යලය ගීත ii. ලක්ෂණ ගීත iii. ස්වර අභ්‍යාස iv. සරළ ගීත

3. කල්‍යාණ මේලගත රාගය නම්

   i. භූපාලි ii. බිලාවල් iii. කාෆි iv. මේ කිසිවක් නොවේ

4. රාගයක් හඳුනාගැනීම සඳහා උපකාරී වන්නේ

   i. ගානසමය ii. රාග ජාතිය iii. වාදී ස්වරය iv. රාග සංගති

5. (අ) සධසරිග-ගපධස (ආ) සරිගුසරිප- මෙහි (අ) (ආ) යන ස්වර ඛණ්ඩ අයත් රාග පිළිවෙලින්

   i. භූපාලි- කාෆි ii. භූපාලි- බිලාවල් iii. බිලාවල්- කාෆි iv භූපාලි- කාෆි

නිවැරදි පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

6. ස්වර අභ්‍යාස .... නමින් ද හඳුන්වයි.
7. කාෆි රාගයේ.............. හා .... යන ස්වර කෝමලව යෙදේ.
8. භූපාලි රාගයේ ජාතිය ....වේ.
9. බිලාවල් රාගයේ වාදී ස්වරය හා භූපාලි රාගයේ සංවාදී ස්වරය .... වේ.
10. මධ්‍යමය සහ නිෂාදය වර්ජිත වන්නේ .... රාගයේය.

පිළිතුරු සපයන්න.

11. බිලාවල් සහ කාෆි රාග වල මුඛ්‍යාංග ලියා දක්වන්න.
12. ඉහත රාග තුනට අයත් ස්වර සංගති 03 ක් ලියන්න.
13. සගරිස̣ / රිමගරි / - - - - යන ස්වර පල්ටාව උච්ච සප්තකය දක්වා වර්ධනය කර ලියන්න.

14. කාෆි රාගයට අදාළව පහත ස්වර අභ්‍යාසය උච්ච සඨ්ජය දක්වා සම්පූර්ණ කරන්න.

සරිස

සරිගුරිස

15. පහත දැක්වෙන භූපාලි රාගයට අදාළ ස්වර අභ්‍යාසය නිදසුන්වල දී ඇති ආකාරයට විස්තාරණය කර ලියන්න.

සරි

ගගරිස සධ්‍රිස

ගප

ගපධප

ගපධසංධප

උත්තර භාරතීය රාගධාරී සංගීතයේදී උපයෝගී කරගන්නා සංගීත භාණ්ඩ



වයලීනය



තාම්පුරාව



තබ්ලාව



ශාස්ත්‍රීය ගායනයක්

හාර්මෝනියම්

විෂය -: පෙරදිග සංගීතය	9 ශ්‍රේණිය
පාඩම / ඒකකය -: මේලය,රාගය,ජාතිය,වාදී,සංවාදී,වර්ජිත,අනුවාදී,විවාදී ස්වර යන පාරිභාෂික වචන	
පාසල -: අම්/බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල	
ගුරුවරයාගේ නම -: M.A.C.S මඩමේ ආරච්චි	

රාග

- රාග යනු භාරතීය ශාස්ත්‍රීය සංගීතයේහි ප්‍රධාන සංකල්පයකි.
- භාරතීය ශාස්ත්‍රීය සංගීත පද්ධතිය තුළ ඇති සියලුම කෘති බිහිවී ඇත්තේ මෙම රාග පදනම් කොටගෙනය .

රාගයක තිබිය යුතු ලක්ෂණ,

- ❖ අසන්නාගේ සිත තුළ රසයක් ජනිත කිරීමේ හැකියාව ඇති ස්වර රචනයකි.
- ❖ අවම වශයෙන් ස්වර පහක්වත් තිබිය යුතුය.
- ❖ ආරෝහණ අවරෝහණ දෙකම තිබිය යුතුය.
- ❖ ම, ප ස්වර දෙක එකවර අත් නොහළ යුතුය.
- ❖ රාගයකින් තවත් රාගයක් වෙන්කොට හඳුනාගත හැකි විය යුතුය.
- ❖ වාදී සංවාදී ස්වර අනිවාර්යයෙන් තිබිය යුතුයි.
- ❖ ශෘංගාර ,වීර ,භක්ති ආදී විවිධ රසභාවයන් ජනිත කිරීමට හැකියාවක් රාගය සතුවිය යුතුය.

ථාට

ථාටයක තිබිය යුතු ලක්ෂණ,

- ස්වර හතම තිබිය යුතුය.
- ථාට ගායනය පිණිස නොවන නිසා රස භාවයක් ඇති නොකරයි.
- ස්වර හත අනුපිළිවෙළින් තිබිය යුතුය.

උදාහරණ: කල්‍යාණ ථාටය : ස රි ග ම ප ධ නි ස
භූපාලි රාගය : ස රි ග ප ධ ස

හින්දුස්ථානී සංගීතයේ දස ථාටය

1	යමන් (කල්‍යාණ)	ස රි ග ම් ප ධ නි ස්
2	බිලාවල්	ස රි ග ම ප ධ නි ස්
3	කාෆි	ස රි ග ම ප ධ නි ස්
4	භෛරව	ස රි ග ම ප ධ නි ස්
5	භෛරවී	ස රි ග ම ප ධ නි ස්
6	ඛමාජ්	ස රි ග ම ප ධ නි ස්
7	ආසාවරී	ස රි ග ම ප ධ නි ස්
8	පූර්වි	ස රි ග ම් ප ධ නි ස්
9	මාර්වා	ස රි ග ම් ප ධ නි ස්
10	තෝඩි	ස රි ග ම් ප ධ නි ස්

වාදී ස්වර

- ❖ රාගයක යෙදෙන ප්‍රබලම ස්වරය වේ.
- ❖ එය ජීව ස්වර ලෙස හඳුන්වයි .
- ❖ රාගයක නිරන්තරයෙන්ම වැඩි වශයෙන් යෙදෙන්නේ වාදී ස්වරයයි.

උදාහරණ : බිලාවල් රාගය 'ධ"
යමන් රාගය 'ග''

සංවාදී ස්වර

- ❖ වාදී ස්වරයට පසුව යෙදෙන ප්‍රබලම ස්වරය සංවාදී ස්වරයයි.
- ❖ සංවාදි ස්වරය රාගයක පිහිටීමේ නිශ්චිත ක්‍රම වේදයක් ඇත.
- ❖ සංවාදි ස්වරය වාදි ස්වරයේ සිට 4 වෙනි හෝ 5 වෙනි ස්වරයේ පිහිටයි.
- ❖ රාගයක වාදි ස්වරයේ සිට 4 වෙනි ස්ථානයේ සංවාදී ස්වරය පිහිටන්නේ නම් මධ්‍යමභාව සංවාදි ලෙස හඳුන්වයි. රාගයක වාදි ස්වරයේ සිට 5 වෙනි ස්ථානයේ සංවාදි ස්වරය පිහිටන්නේ නම් පංචමභාව සංවාදි ලෙස හඳුන්වයි
- ❖ වාදී ස්වරය ට පසුව යෙදෙන ප්‍රබලම ස්වරය සංවාදී ස්වරයයි .

උදාහරණ : බිලාවල් රාගය 'ග'
යමන් රගය 'නි'

අනුවාදී ස්වර

- ❖ වාදී, සංවාදී ස්වර හැරුණු කොට රාගයේ යෙදෙන අනෙකුත් ස්වර අනුවාදී ස්වර ලෙස හඳුන්වයි.

උදාහරණ :

- බිලාවල් රාගයේ අනුවාදී ස්වර.
  ස.රි.ම.ප.නි
- යමන් රාගයේ අනුවාදී ස්වර
  ස.රි.ම.ප.ධ

වර්ජිත ස්වර

- ❖ රාගයක කිසිසේත්ම නොයෙදෙන ස්වර වර්ජිත ස්වර වේ.

උදාහරණ :

- භූපාලි රාගයේ ම,නි ස්වර නොයෙදේ.

විවාදී ස්වර.

- ❖ රාගයක සාමාන්‍යයෙන් නොයෙදෙන එහෙත් රාගයක් අලංකාර කර ගැනීම සඳහා පමණක් නිසි තැන යෙදෙන ස්වර විවාදී ස්වරයයි. මෙම ස්වර රාග අලංකාර කර ගැනීමට යොදා ගනී.

උදාහරණ :

- කාෆි රාගයේ ශුද්ධ නිෂ්පාදය යොදා ගනී.

රාගයක ආරෝහණ සහ අවරෝහණයේ යෙදෙන ස්වර සංඛ්‍යව අනුව රාගයක ජාතිය තීරණය වේ .
මූලික රාග ජාති තුනකි.

1. සම්පූර්ණ
2. ෂාඩව
3. ඖඩව

ආරෝහණ	අවරෝහණ	ජාතිය
7	7	සම්පූර්ණ
6	6	ෂාඩව
5	5	ෂාඩව
6	7	ෂාඩව සම්පූණ
6	6	ෂාඩව ෂාඩව
6	5	ෂාඩව ඖඩව
5	7	ඖඩව සම්පූර්ණ
5	6	ඖඩව ෂාඩව
5	5	ඖඩව ඖඩව

මේ අනුව මූලික රාග ජාති තුනෙන් රාග ජාති හයක් බිහිවේ. එවිට රාග ජාති නවයක් බිහිවේ.

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .

1. හින්දුස්ථානි සංගීතයේ ථාට,

   (1) 10 කි. (2) 8කි. (3) 12කි (4) .72කි.

2. රාගයක තිබිය හැකි අවම ස්වර ගණන වන්නේ

   (1.) 1 කි. (2) 5 කි. (3) 7 කි. (4) .6කි

3. රාගයක වාදී ස්වරය මේ නමින් හඳුන්වයි

   (1) අනුවාදී ස්වරය (2) වර්ජිත ස්වරය (3) ජීව ස්වරය (4) විවාදී ස්වරය

4. රාගයක් අලංකාර කර ගැනීම සඳහා යොදා ගන්නා ස්වරයයි.

   (1) වාදී ස්වරය (2) විවාදී ස්වරය (3) අනුවාදී ස්වර ය (4) වර්ජිත ස්වරය

5. බිලාවල් රාගයේ වාදී ස්වරය

   (1) ග (2) ප (3) ස (4) ධ

6. වර්ජිත ස්වර යෙදෙන රාගයකි

   (1) භූපාලි (2) බිලාවල් (3) කාෆි (4) යමන්

7. ආරෝහණයේ ස්වර හයක් සහ අවරෝහණයේ ස්වර හතක් යෙදෙන රාග ජාතිය වන්නේ,

(1) ෂාඩව ඖඩව (2) ෂාඩව සම්පූර්ණ (3) ඖඩව සම්පූර්ණ (4) ඖඩව ඖඩව

8. දස ථාටය හඳුන්වා දුන් සංගීතඥයා වන්නේ,

(1) භාත්ඛණ්ඩේ පඬිතුමා (2) ව්‍යංඛයමුඛි පඬිතුමා

(3) රතන්ජංකර් පඬිතුමා (4) සාරංග දේව පඬිතුමා

9. රාගයක වාදී ස්වරයට දෙවෙනි වන ස්වරය වන්නේ,

(1) වාදී ස්වරය (2) විවාදී ස්වරය

(3) සංවාදී ස්වරය (4) වර්ජිත ස්වරය

10. රාගයක නොයෙදෙන ස්වර

(1) සංවාදී ස්වරය (2) විවාදී ස්වරය

(3) අනුවාදී ස්වරය (4) වර්ජිත ස්වරය

කෙටි පිළිතුරු සපයන්න.

1. දස ථාටය නම් කරන්න
2. ථාට යන්න නිර්වචනය කරන්න.
3. රාග යන්න නිර්වචනය කරන්න.
4. රාග ජාති යනු මොනවාද?
5. රාගයක යෙදෙන ස්වර වර්ග නම් කරන්න.







විෂය -:පෙරදිග සංගීතය 9 ශ්‍රේණිය
පාඩම / ඒකකය -:ආරෝහණ /අවරෝහණ/මුඛ්‍යාංගය
පාසල -: අම්/බණ්ඩාරනායක බා.මා.වි
ගුරුවරයාගේ නම -:M.A.C.S මඩමේ ආරච්චි

ආරෝහණ /අවරෝහණ

- රාගයක් හඳුනා ගැනීමට එම රාගයෙහි ආරෝහණ අවරෝහණ ස්වර වැදගත් වේ
- රාගයක් ගැඹුරින් අධ්‍යයනය කිරීමේ පළමු පියවර ආරෝහණ අවරෝහණ ස්වරයි.
- ගායනය වාදනය කරන සියල්ලන්ම රාගය තහවුරු කරගැනීම සඳහා වැඩිකාලයක් අභ්‍යාස කරන්නේ ආරෝහණ අවරෝහණ ස්වරයි .

උදාහරණ :

බිලාවල් රාගයේ ,

ආරෝහණ ස්වර : ස,රි,ග,ම,ප,ධ,නි,සං

අවරෝහණ ස්වර : සං,නි,ධ,ප,ම,ග,රි,ස

භූපාලි රාගය,

ආරෝහණ : ස,රි,ග,ප,ධ,සං

අවරෝහණ : සං,ධ,ප,ග,රි;ස

මුඛ්‍යාංගය

රාගයක් හඳුනා ගැනීම සඳහා ඇති කෙටිම ස්වර ඛණ්ඩය මුඛ්‍යාංගයයි.
බ්‍රින්දාවන් මෙය රාගයක මුහුණ වැනිය.
රාගයෙන් රාගයට මුඛ්‍යාංග ස්වර වෙනස් වෙයි.

රාගය	අරෝහණ	අවරෝහණ	මුඛ්‍යාංගය
බිලාවල්	ස රි ග ම ප ධ නි සං	සං නි ධ ප ම ග රි ස	ග රි ග ප, ධ නි සං
යමන්	ස රි ග ම් ප ධ නි සං	සං නි ධ ප ම් ග රි ස	නි රි ග රි ස, ප ම් ග රි ස
කාෆි	ස රි ග ම ප ධ නි සං	සං නි ධ ප ම ග රි ස	සං ස, රි රි, ග ග, ම ම, ප

පහත සඳහන් ප්‍රශ්න අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.

(1.) රාගයක් හඳුනාගත හැකි කෙටිම ස්වර ඛණ්ඩය වන්නේ ,

1. වාදී ස්වර
2. ආරෝහණ ස්වර
3. අවරෝහණ ස්වර
4. මුඛ්‍යාංගය

(2) බිලාවල් රාගයේ ආරෝහණ ස්වර නම් ,

1. ගරි ගප ධනිසං
2. නිරිගමප
3. සරිගපධසං
4. සරිගමපධනිසං

(3) යමන් රාගයෙන් මුඛ්‍යාංග ස්වර වන්නේ,

1. නිරිගරිස,පමගරිස.
2. ගරිගප ධනිසං
3. රිමප නිධප
4. සසරිරි ගගමමප.

(5) මුඛ්‍යාංගය රාගයක ,

1. කුඩාම ස්වර කණ්ඩයයි
2. ආරෝහණ ස්වර කණ්ඩයයි
3. මුඛ්‍ය ස්වර කණ්ඩයයි
4. පහසුම ස්වර ක්ණ්ඩයයි

(6) ස̇නිධපමගරිස මෙය,

1. බිලාවල් රාගයෙ ආරෝහණයයි
2. බිලාවල් රාගයෙ අවරෝහණයයි
3. යමන් රාගයේ ආරෝහණයයි
4. යමන් රාගයේ අවරෝහණයයි

(7) නි̣රිගරිස පමගරිස මෙය අයත්වන රාගය වන්නේ,

1. යමන් රාගය
2. භෛරවී රාගය
3. කාෆි රාගය
4. භූපාලි රාගය

(8) ගපධනිස̇රි̇ මෙහි ස්වර රටාව,

1. ආරෝහණ ක්‍රමයට අයත්ය.
2. අවරෝහණ ක්‍රමයට අයත්ය.
3. සංචාරී ක්‍රමයට අයත් ය .
4. මේ කිසිවක් නොවේ.

(10) සරිගපධස මෙය අයත් රාගය වන්නේ.

1. භූපාලි රාගය
2. යමන් රාගය
3. බිලාවල් රාගය
4. කාෆි රාගය

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. භූපාලි රාගයේ ආරෝහණ ස්වර නම් කරන්න .
2. මුඛ්‍යාංග යනු කුමක්ද ?
3. භූපාලි රාගයෙ ආරෝහන අවරෝහන ස්වර ලියන්නන්.
4. කාෆි රාගයේ මුඛ්‍යාංගය ලියන්න .
5. බිලාවල් රාගයෙ මුඛ්‍යාංගය කුමක්ද?

විෂය -: පෙරදිග සංගීතය
පාඩම / ඒකකය -: බිලාවල්/භූපාලි/කාෆි රාගයන්හි ලක්ෂණ ගී:
පාසල -: අම්/බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල
ගුරුවරයාගේ නම -: M.A.C.S මඩමේ ආරච්චි

9 ශ්‍රේණිය

ලක්ෂණ ගීත.

- රාග ලක්ෂණ මතු කරමින් ගයන ගී රාග ලක්ෂණ ගීත නම් වේ.
- උතුරු ඉන්දියානු ශාස්ත්‍රීය සංගීතයේ එන මධ්‍ය ලය ගී සර්ගම් මෙන්ම ලක්ෂණ ගී ද රාගයකට අදාලව නිර්මාණය වී තිබේ.
- රාගයක ඇතුළත් වාදී සංවාදී, ගායන සමය, මුඛ්‍යාංග ආදී ලක්ෂණ ඇතුළත් කරමින් ගීත ප්‍රබන්ධ වී තිබේ .
- මෙම ගීත මධ්‍යලයෙන් ගායනය කරනු ලැබේ.
- ත්‍රිතාල් දාදරා ආදී හින්දුස්ථානී තාල පද මත නිර්මාණය වී ඇත .

❖ බිලාවල් ලක්ෂණ ගීතය, තාලය - ත්‍රිතාල්

සපිරුණු රතියේ සුගැයෙන උදයේ
ජනක බිලාවල හැම ස්වර සුදුවේ
ගපධනිස යන ස්වර සංගතවේ
ධ ස්වර වාදී ග සංවාදී

❖ භූපාලි ලක්ෂණ ගීතය, තාලය - ත්‍රිතාල්

රාගිනි ඖඩව ගයමු භූපාලි
කළණ මේල ගත ශාන්ත රස ධාරි.
ග ස්වර වාදී ධ සංවාදී
මනි හැර රෑ පෙරයම ගැයෙනා.

❖ කාෆි ලක්ෂණ ගීතය , තාලය - ත්‍රිතාල්

සැම ප්‍රිය කරනා ඉමිහිරි කාෆි
රාගයෙ ජාතිය පූරන වේ නිති
සුගැයෙන රාත්‍රී මධ්‍යම යාමේ
පංචම වාදී ස සංවාදී
කාෆි මේලයෙහි උපදින මෙහි නිති
ග නි කෝමළ සෙසු ස්වර ශුද්ධය
නැගයේ බැසයේ සරිගුමපධනිස්
ස්නිධපමගුරිස

පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.

(1) බිලාවල් රාගයේ හැම ස්වර සුදු වේ යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද ?

1. ස්වර සුදු පාට වේ 2. ශුද්ධ ස්වර වේ 3. ස්වර කෝමල වේ 4. විකෘති වේ

(2) බිලාවල් රාගයේ ස්වර සංගතියක් ගැන කියැවේ එම ස්වර මොනවාද ?

1. මගමරි 2. ගපධනිසං 3. මගමරිස 4. ගමගරිස

(3) මෙහි ජනක බිලාවල යනුවෙන් කියවෙන්නේ ,

1. බිලාවල් ථාටයෙන් බිහිවන බවයි 2. යමන් ථාටයෙන් බිහිවන බවයි

3. කාෆි ථාටයෙන් බිහිවන බවයි 4. ගීතයේ අලංකාරය සඳහා එසේ යොදා ඇති බවයි

(4) භූපාලි රාගය අයත්වන්නේ ,

1. ෂාඩව ජාතියට ය 2. ඖඩව ජාතියට ය

3. සම්පූර්ණ ජාතියට ය 4. ෂාඩව සම්පූර්ණ ජාතියට ය

(5) භූපාලි රාගයෙන් මතුවන රසය නම් ,

1. ශෘංගාර රසය 2. ශාන්ත රසය 3. කරුණා රසය 4. වීර රසය

(6) මෙහි වාදී සංවාදී ස්වර වන්නේ ,

1. ගධ 2. ධග 3. ගනි. 4. පස

(7) කාෆි රාගය අයත් ජාතිය වන්නේ ,

1. ඖඩව 2. ෂාඩව

3. සම්පූර්ණ 4. මේ කිසිවක් නොවේ.

(8) කාෆි රාගය රාගයේ වාදී සංවාදී ස්වර පිළිවෙලින්,

1. ග නි 2. ධ ග 3. ප ස 4. ම ස

(9) කාෆි රාගයේ ගීතයෙන් කියවෙන කෝමළ ස්වර දෙක මොනවාද?

1. රි ග 2. රි ධ 3. ධ ග 4. ග නි

(10) භූපාලි රාගයේ නොමැති ස්වර ලෙස සඳහන් වන්නේ මොනවාද ?

1. ප ස 2. රි ග 3. ම නි 4. ධ ග

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ලක්ෂණ ගීතයේ සඳහන් අන්දමට කාෆි රාගයේ ගායන සමය කුමක්ද?
2. බිලාවල් රාගයේ හැම ස්වර සුදුවේ යන්නෙන් අදහස් වන්නේ කුමක්ද ?
3. භූපාලි රාගය අයත් ථාටය නම් කරන්න .
4. ඉහත සඳහන් රාග තුන අතරින් සම්පූර්ණ ජාතියට අයත් රාග නම් කරන්න .
5. භූපාලි රාගයෙ ආරෝහන අවරෝහන ස්වර ලියන්න.

විෂය : පෙරදිග සංගීතය　　　　　　　　　　ශ්‍රේණිය : 09 ශ්‍රේණිය

පාඩම/ඒකකය : විදුලි ඕගනයේ මූලිකාංග

ගුරුවරයාගේ නම : එම්.ඒ.ඩී.තාරන දිනුක　　　　පාසල : අම්/හෑගොඩ ශ්‍රී ඉන්දසාර විද්‍යාලය

විදුලි ඕගනයේ මූලිකාංග



- විදුලි ඕගනය වර්ථමාන සංගීත ලෝකයේ වැඩි ප්‍රමුඛතාවයක් මත යොදා ගැනෙන සංගීත භාණ්ඩයකි. අතීතයේ පටන් **Pipe Organ** භාණ්ඩය ආශ්‍රයෙන් වැඩිදියුණු වී පසුකාලීනව සින්තසයිසර්(**Synthesizer**) දක්වා ද අද වන විට **Workstation** තාක්ෂණය දක්වා වැඩිදියුණු වී ඇත.
- අද වන විට විවිධ මාදිලි වලින් අති නවීන පහසුකම් සහිතව විශ්වීය සංගීත නිර්මාණයන් කළ හැකි නාද ගබඩාවක් බවට පත් වී හමාරය.
- ලෝකයේ විවිධ සම්ප්‍රදායන්ට යටත්ව සියලු සංගීත භාණ්ඩයන්ගේ හඬ(**Samples**) විදුලි ඕගනය තුලින් මැවීමේ හැකියාව සමඟ තනි පුද්ගලයෙකුට වුවද සංගීත භාණ්ඩ විශාල ප්‍රමාණයක හඬ ලබා ගැනීමේ හැකියාව මේ තුළ පවතී.
- **Work Station** තාක්ෂණය ඔස්සේ ගීතයක් නිර්මාණය කර පටිගත කිරීමේ මෙන්ම විවිධ තාල වාද්‍ය භාණ්ඩ හා විවිධ ස්වර වාද්‍ය භාණ්ඩ මිශ්‍ර කොට නිර්මාණයේ උසස් බව වැඩි දියුණු කළ හැකිය.
- සාමාන්‍ය ජනතාව අතර ප්‍රචලිත විදුලි ඕගනයක් ලෙස **YAMAHA** ඉතා ජනප්‍රිය අතර **CASIO, ROLAND, KORG** තවත් කිහිපයකි. මේවායේ ප්‍රමාණ අනුව සප්තක 7ක් දක්වාම දිවෙන විදුලි ඕගන ඇත.
- ප්‍රසංග වේදිකා වල, ඒක පුද්ගල/ ද්වි පුද්ගල සංගීත කණ්ඩායම් වල පෙරදිග වාද්‍ය වෘන්ද වල මෙම භාණ්ඩයට විශේෂ තැනක් හිමි වේ.
- එක් එක් විදුලි ඕගනයන්හි වෙනස් තාක්ෂණයන් ඔස්සේ නවීනත්වය අනුව විවිධ අයුරින් වෙනස් වුවද සෑම ඕගනයකටම පොදු ක්‍රියාවලින් කිහිපයකි. එවා ඉතා සරළව **Button** එකක් අධාරයෙන් වෙනස් කළ හැක.



➢ **Voice/ Tone**

මින් විවිධ සංගීත භාණ්ඩයන්ගේ හඬ තෝරා ගැනෙන අතර නිර්මාණයට ගැලපෙන ඕනෑම සංගීත භාණ්ඩයක හඬ අංකයක් මගින් හෝ **Select** කිරීමක් මගින් තෝරාගත හැකි වේ. නවීන විදුලි ඕගනයන්හි මෙම **Tones Registry** එකක ගබඩා කර ක්ෂණයකින් නැවත ලබා ගැනීමට හා නාදයන් මාරු කරමින් වාදනයට හැකියාව ඇත.

➢ **Style**

Drum Beat එක හෙවත් තාලය ලබා ගත හැකිය. ගීතයට ගැලපෙන **Rhythm** එක අනුව **Beat** එක තෝරා ගත් පසුව එහි වේගය(**Tempo**) අඩු වැඩි කරගත හැකිය.

➢ **Auto Accompany(Auto Accomp)**

තෝරාගත් **Drum Beat** එක අනුව ගීතයට ගැලපෙන **Bass, Rhythm, Pad** ආදිය සමඟ වාදනය වේ. මෙයද

- **Fingered** – (**Chord** එකකට අවශ්‍යය සියලු ස්වර වාදනය)
- **Single Fingered** – (**Chord** එකෙහි පළමු ස්වරය පමණක් වාදනය) යනුවෙන් කොටස් 2කි.

➢ **Pitch Bender**

වාදනය වන ස්වරය ඉහළට සහ පහළට හඬ නොකඩවා හඬ අඩු වැඩි කරයි. මෙය සෑම විදුලි ඕගනයකම වමතින් ක්‍රියා කළ හැකි සේ වම් පසට වන්නට පිහිටා ඇත.

නිවැරදි පිළිතුර තෝරන්න.

1. විදුලි ඕගනය නිර්මාණය වීමට මූලික වශයෙන් බලපෑ සංගීත භාන්ඩය වන්නේ,

   (1) Mouth Organ　　(2) Synthesizer　　(3) Pipe Organ　　(4) Piano

2. විදුලි ඕගනයේ ක්‍රියාකාරිත්වයට .... භාවිතා වේ.

(1) තත් (2) සුළඟ (3) සම් (4)විද්‍යුතය

නිවැරදි පිළිතුර යා කරන්න.

3. Voice Button	Drum Beat තෝරා ගැනීම
4. Auto Accompany	වේගය අඩු වැඩි කිරීම
5. Work Station	Drum Beat, Bass, Rhythm, Pad සමග වාදනය
6. Style Button	නාදය තෝරාගැනීම.
7. Tempo Button	ගීත පටිගත කිරීම

8. Pitch Bender මගින්

(1) අති උච්ච ස්වර වාදනය කළ හැක. (2) හඬ උස් පහත් කළ හැක.

(3) තාලය වෙනස් කළ හැක. (4) සංගීත භාණ්ඩ වෙනස් කළ හැක.

9. Tone Registry එකෙහි

(1) ගීත ගබඩා කළ හැක. (2) තාල ගබඩා කළ හැක.

(3) නාද ගබඩා කළ හැක. (4) නාද උස් පහත් කළ හැක.

10. ශ්‍රී ලංකාවේ ජනයා අතර වඩාත් ප්‍රචලිත විදුලි ඕගනය,

(1) YAMAHA (2) KORG (3) CASIO (4) ROLAND

පහත ප්‍රශ්න වලට අදාල පිළිතුරු සපයන්න.

01. විදුලි ඕගන වර්ග කිහිපයක් ලියා දක්වන්න.

.... , ... , ... , ...

02. නවීන විදුලි ඕගනය වැඩි දියුණුවට පෙර වාද්‍ය භාණ්ඩ 2 නම් කරන්න.

.... , ...

03. Auto Accompany පහසුකම යටතේ ඇති කොටස් දෙක කෙටියෙන් විස්තර කරන්න.

....

....

....

....

04. Pitch Bender යොදාගත හැකි අවස්ථා ලියා දක්වන්න.

....

....

05. විදුලි ඕගනය භාවිතයට ගැනෙන අවස්ථා ලියා දක්වන්න.

....

....

....

විෂය : පෙරදිග සංගීතය | ශ්‍රේණිය : 09 ශ්‍රේණිය

පාඩම/ඒකකය : එකෝඩියන් භාණ්ඩයේ ස්වර පිහිටන අයුරු

ගුරුවරයාගේ නම : එම්.ඒ.ඩී.තාරන දිනුක | පාසල : අම්/හෑගොඩ ශ්‍රී ඉන්දසාර විද්‍යාලය

එකෝඩියනය



- යුරෝපීය රටක උපත ලද එකෝඩියනය(**Accordian**) සුෂිර(**Wind**) වාද්‍ය භාණ්ඩ ඝණයට ගැනෙන බටහිර වාද්‍ය භාණ්ඩයකි.
- **Button Accordian** හා **Piano Accordian** යනුවෙන් වර්ග දෙකකි. මෙය එකෝඩියනයේ ස්වර පුවරුවට යොදා ගැනෙන **Keys** අනුව වෙනස් වේ.
- එකෝඩියන් වාදකයා **Accordianist** යනුවෙන් හඳුන්වයි.



- අත් දෙකම උපයෝගී කොට ගෙන වාදනයේ නියැලේ. දකුණතින් ස්වර පුවරුව වාදනය කරනු ලබයි. එය පියානෝවේ ස්වර පුවරුවට සමාන වේ.
- වමතින් ක්‍රියාත්මක කළ හැකි බැලෝව(**Bellow**) ඇතුළට තල්ලු කිරීම හා එළියට ඇදීම සිදු කරන අතර බැලෝවෙහි පිහිටා ඇති **Base Button** මගින් කෝඩ්ස්(**Chords**) වයනු ලබයි.
- මෙහි හඬ නිපදවීමේ ක්‍රියාකාරීත්වය සර්පිනාවට සමාන වන අතර සර්පිනාවෙහි බැලෝවට වඩා දිගින් වැඩිවේ. බැලෝව ඇදීමේදී හා තල්ලු කිරීමේදීද හඬ නිපදවන ආකාරයට එක් ස්වරයකට නළා(**Reed**) 2ක් යොදා ඇත. බැලෝව මගින් නිපදවන සුළං පීඩනය නාදය නිපදවීමට යොදා ඇති නළා තුලින් ගමන් කර නාදය උපදවා ගනී.
- කරෙහි එල්ලාගෙන වාදනය කරන මෙහි **Bass Button** ගණන අනුව ප්‍රමාණ කිහිපයකි(**16, 18, 32, 64 Basses**). ප්‍රමාණය අනුව ස්වර සප්තක 2 සිට සප්තක 3 $^1/_2$ දක්වා ස්වර පිහිටනු ලබයි.
- තිරස් අතට **Base Button** 4, 6, 8 ආකාරයෙන් පෙළ ගැසී ඇත. බැලෝවෙහි සිට සිරස් අතට දෙවන පෙළෙහි මැදට වන්නට මධ්‍ය ෂඩ්ජය(**Middle C**) පිහිටා ඇත. එහි උඩු කොටස ඇතුළට නෙරා ඇති නිසා ඇඟිල්ලෙන් පිරිමැදීමෙන් පහසුවෙන් හඳුනාගත හැක.
- ගීතයක තනුවත් රිද්මයට අනුව කෝඩ්ස් වාදනයත් යන දෙකම වාදනයෙහි හැකියාව මෙම වාද්‍ය භාණ්ඩය සතුවේ. නූතනයේ ව්‍යාවහාරික සංගීතයේදී ගීතවලට යොදා ගැනෙන අවස්ථාද ඇත.
- ලෝකප්‍රකට එකෝඩියන් අතර **Hohner** නැමති එකෝඩියනය ජනප්‍රියත්වක් උසුලන අතර විශාලත්වයෙන් හා මිළ අධික බවින් යුක්තය.

නිවැරදි පිළිතුර තෝරන්න.

1. බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව එකෝඩියනය
   (1) Wind (2) Percussion (3) String (4) Brass
2. එකෝඩියනයෙහි ස්වර පුවරුවට සමාන ස්වර පිහිටීම අඩංගු සංගීත භාණ්ඩ යුගලය වන්නේ,
   (1) සර්පිනාව,පියානෝව (2) පියානෝව,ගිටාරය (3) වයලීනය,පියානෝව (4)මෙලෝඩිකාව,හාර්මෝනිකා
3. බැලෝව මගින් උපදවනුයේ හඬ නිපදවීමට අවශ්‍යය,
   (1) ස්වරයි. (2) වේගයයි. (3)සුළඟයි. (4) තාලයයි.
4. එකෝඩියනය .... සංගීත වාද්‍ය භාණ්ඩයකි.
   (1) අප්‍රිකානු (2) ආසියානු (3) චීන (4) බටහිර
5. හඬ නිපදවීම අනුව එකෝඩියනයට සමාන වන වාද්‍යය භාණ්ඩය වනුයේ,
   (1) හාර්මොනිකා (2) පියානෝව (3) මෙලෝඩිකාව (4) සර්පිනාව
6. බැලෝව ඇදීම හා තල්ලු කිරීම යන දෙආකාරයෙන්ම හඬ නිපදවීමට නළා ......ක් යොදා ගනී.
   (1) 2 (2) 1 (3) 3 (4) 4

7. නිවැරදි වරණය තෝරන්න.

(1) එකෝඩියනයේ ක්‍රියාකාරීත්වයට විද්‍යුතය යොදා ගැනේ.

(2) ගීතයක නාද මාලාව හා රිද්මය එක වර වැයීම සිදු කල හැක.

(3) එකෝඩියනයට ස්වර සප්තක 7ක් ඇත.

(4) උත්තර භාරතීය සංගීතයට අයත් වාද්‍ය භාණ්ඩයකි.

8. **Base Button** මගින්

(1) හඬ උස් පහත් කළ හැක.

(2) නාදයේ තීව්‍රතාව වැඩි කළ හැක.

(3) රිද්මයානුකූලව කෝඩ්ස් වාදනය කළ හැක.

(4) අති උච්ච ස්වර වාදනය කළ හැක.

9. **Accordianist** යනු

(1) එකෝඩියන් වාදන ශෛලියකි.

(2) එකෝඩියනයේ කොටසකි.

(3) එකෝඩියනයට ජර්මානු බසින් හඳුන්වන නාමයයි.

(4) එකෝඩියන් වාදකයා හඳුන්වන නාමයයි.

10. එකෝඩියනයක සාමාන්‍ය ස්වර සප්තක ගණන,

(1) 3 - 4 (2) 1 - 2 (3) $4\,{}^1/_2 - 5\,{}^1/_2$ (4) $2 - 3\,{}^1/_2$

පහත ප්‍රශ්න වලට අදාල පිළිතුරු සපයන්න.

01. එකෝඩියනයේ ස්වර පුවරුවට සමාන ස්වර පුවරු සහිත සංගීත භාණ්ඩ 4ක් ලියා දක්වන්න.

.... , ... , ... , ...

02. එකෝඩියන් වර්ග දෙක ලියා දක්වන්න.

.... , ...

03. එකෝඩියනයේ ක්‍රියාකරීත්වය සැකෙවින් විස්තර කරන්න.

....

....

....

04. එකෝඩියනයේ වාදන ඉරියව්ව කෙටියෙන් ලියා දක්වන්න.

....

....

....

05. ව්‍යවහාරික සංගීතයේ එකෝඩියනය යොදාගත් අවස්ථා ලියා දක්වන්න.

....

....

....

....

විෂයය :- පෙරදිග සංගීතය	ශ්‍රේණිය :- 09
ඒකකය/පාඩම :- ගිටාරයේ ස්වර පිහිටීම	
ගුරුවරයාගේ නම :- ඩබ්.ඒ.කුමුදු නිශාන්ත	පාසල:- අම්/ගලහිටියාගොඩ මහා

ගිටාරයේ කොටස් සහ ස්වර පිහිටන අයුරු

* ගිටාරය ලෝකය පුරා ජනප්‍රිය වී ඇති බටහිර සංගීත භාණ්ඩයකි.ලාංකේය සංගීත අධ්‍යාපනය තුළ පාසල් සංගීතයේ සාමාන්‍ය පෙළ,උසස් පෙළ හා විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වාම ගිටාරය භාවිත වේ.හින්දුස්ථානි සංගීතයට ගිටාරය යොදා ගැනීම නව ප්‍රවණතාවකි.ලංකාවේ ව්‍යවහාරික සංගීතයේද මෙය ඉතා ජනප්‍රිය වී ඇත.



<u>ගිටාරයේ තත් සුසර කිරීම</u>



* මේ ආකාරයට ස්වර පුවරු භාණ්ඩ වන හාර්මෝනියම්,පියානෝ,ඉලෙක්ට්‍රොනික් යතුරු පුවරුවක් (key board) ආධාරයෙන් ගිටාරය සුසර කර ගත හැකිය.එමෙන්ම Tunner(ටියුනර්) ද භාවිත කරයි.වර්තමානයේ මේ සඳහා ඇන්ඩ්‍රොයිඩ් දුරකථනයක (Androied phone) ටියුනින් ඇප් (Tunning app) එකක් මගින්ද ගිටාරය සුසර කර ගත හැකිය.

<u>ගිටාරයේ ස්වර පිහිටීම</u>

සාමාන්‍ය ගිටාරයක යාබද ෆ්‍රෙට් වල යෙදෙන්නේ අර්ධ ස්වරයි.ඒ අනුව ගිටාරයේ ස්වර පිහිටන ආකාරය පහත දැක්වේ.







01 - 05 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු වරහන තුළින් තෝරන්න.

01. ගිටාරය .... සම්ප්‍රදායට අයත් සංගීත භාණ්ඩයකි.
02. ගිටාරයට තත් .... ඇත.
03. ගිටාරය සුසර කර ගැනීමට .... යොදා ගනී.
04. මෙම භාණ්ඩයේ පළමු තත සුසර කරන්නේ .... ස්වරයට ය.
05. මධ්‍ය 'ස' ස්වරය පිහිටන්නේ ගිටාරයේ .... තතෙහි .... fret එක මත ය.
(උච්ච 'ග', පියානෝව , හයක්,පස්වන,තුන්වන,බටහිර)

නිවැරදි පිළිතුර තෝරන්න.

06.ගිටාරයේ ශබ්ද විවරය හඳුන්වන්නේ,

1.sound effect 2.sound hole 3.pick guard 4.sound forge

07.ගිටාරයක ඇඟිලි පුවරුව නම් කරන නිවැරදිම නම වන්නේ,

1.finger bolt 2.fret board 3.neck 4.head

08.ගිටාරයේ පළමු හා හයවන තත සුසර කරනුයේ පිළිවෙලින්,

1.උච්ච ග, මන්ද්‍ර ග 2.අති මන්ද්‍ර ග,මධ්‍ය ග 3.මධ්‍ය ග,මධ්‍ය ධ 4.මධ්‍ය ග,උච්ච ග

09.දෙවෙනි තතෙහි පළමු fret මත පිහිටන ස්වරය වන්නේ,

1.උච්ච ස 2.මධ්‍ය නි 3.උච්ච රි 4.උච්ච ග

10.Tunning key මගින් සිදු කරන්නේ,

1.තත් එකට බැඳීමයි. 2.තත් පෙළීමයි. 3.තත් සුසර කිරීමයි. 4.තත් වාදනය කිරීමයි.

11.ගිටාරයක් සුසර කරන අයුරු බටහිර මෙන්ම පෙරදිග ස්වර නාම සමග රූප සටහනක් ඇසුරින් පිළිවෙලින් ලියා දක්වන්න.

12.ගිටාරයක් ඇඳ එහි කොටස් 06 ක් නම් කරන්න.

13.ස රි ග ම ප ධ නි යන ස්වර හත ගිටාරයේ පිහිටන ස්ථාන ඇඟිලි පුවරුවක්(fret board) මගින් දක්වන්න.

14.රි ග ධ නි ම/ යන ස්වර පිහිටන ස්ථාන ගිටාරයේ රූප සටහනක් මගින් දක්වන්න.

15.පහත රූප සටහනේ දැක්වෙන ස්වර ස්ථාන මොනවාද?



විෂයය :- පෙරදිග සංගීතය	ශ්‍රේණිය :- 09
ඒකකය/පාඩම :- ගිටාරයෙන් කෝඩ්ස් වාදනය කිරීම	
ගුරුවරයාගේ නම :- ඩබ්.ඒ.කුමුදු නිශාන්ත	පාසල:- අම්/ගලහිටියාගොඩ ම.වි.

ගිටාරයෙන් කෝඩ්ස් වාදනය කිරීම

ස්වර වාදනයට මෙන්ම කෝඩ්ස් වාදනයටත් යොදා ගන්නා ගිටාරය ජනප්‍රිය භාණ්ඩයකි.ගිටාර් වාදනය පුහුණුවන ආධුනිකයෙකු ස්වර අභ්‍යාස වාදනයෙන් පසු ස්වරස්ථාන පිළිබඳ අවබෝධයක් ලබයි.එමනිසා කෝඩ්ස් වාදනයේ ආරම්භයට සුදුසු සරල කෝඩ්ස් කිහිපයක් වාදනය කරන අයුරු ඉගෙන ගනිමු.

ඒ සඳහා වම් අතේ ඇඟිලි නියමිත ස්ථානයේ තැබීමට ඇඟිලි අංක ගතකොට දක්වා ඇත.එම නිවැරදි ඇඟිලි භාවිතයෙන් කෝඩ්ස් වාදනය පහසුකර ගත හැකිය.දකුණතින් pick (පික්) එකක් යොදාගෙන වාදනය කිරීමෙන් එහි නාදයේ ගුණාත්මක බව වැඩිකර ගත හැකිය.

ගිටාරය වාදනය කිරීමේදී වම් අතේ ඇඟිලි හසුරවන ආකාරය



වාදනය කිරීමේ පහසුව සඳහා

පළමුව සරල minor_chords කිහිපයක් වාදනය කරන අයුරු ඉගෙනගනිමු.

E minor,D minor හා C minor chords වාදනය කරන ආකාරය

E minor chord





D Minor chord





C minor





D major G major A major chords වාදනය කරන ආකාරය

D major





G major





A major





Major Minor කෝඩ්ස් පිළිබඳව අභ්‍යාස ගතවීමට ¾ බටහිර තාලයට අනුව මෙම කෝඩ්ස් ප්‍රස්ථාරය පුහුණුවන්න.

Minor ¾	Major ¾
Em/ - / - / - /	D / - / - / - /
D / - / - / - /	G / - / - / - /
C / - / - / - /	A / - / - / - /
Em / - / - / - /	D / - / - / - /

නිවැරදි පිළිතුර තෝරන්න.

01.සාමාන්‍ය පුද්ගලයෙකු ගිටාරයේ කෝඩ්ඩ් වලට අදාළ ස්වර පෙන්නුම් කිරීම සඳහා යොදාගනු ලබන්නේ , 1.දකුණු අත 2. අත් දෙකම 3.දකුණතේ ඇඟිලි 4.වම් අත

02.ගිටාර් වාදනයට උපයෝගී කරගනු ලබන්නේ

1.බෝ එකකි. 2. අළුවකි. 3. මිශ්‍රාබයකි. 4.පික් එකකි.

03.E^m කෝඩ් එක ගිටාරයේ වාදනයේදී තබන 2,3 ඇඟිලි වලින් පෙන්නුම් කරන ස්වර වන්නේ

1.ග නි 2.නි ග 3.නි ග 4.ග ධ

04.C^mකෝඩ් එකට අදාළ ස්වර වන්නේ

1.ස ම ප 2.ස ග ප 3.ස <u>ග</u> ප 4.ප ග ස

05.D^m කෝඩ් එකට අදාළ ස්වර වන්නේ

1. රි ම ධ 2. ම/ ධ ස 3. රි ප නි 4.ග ප නි

06.  මෙහි පෙන්නුම් කරන කෝඩ් එක වන්නේ,

1.E Major 2.D Major 3.D Minor 4.G Major

07. G Major කෝඩ් එකට අදාළ ස්වර වන්නේ,

1.ප නි රි 2. ප නි ග 3.ප ග ස 4. ප ධ නි

08.  මෙම කෝඩ් එක නම් කරන්න

1.E Major 2. E Minor 3. A Minor 4. C Major

09.C Minor කෝඩ් එකේ යෙදෙන කෝමල ස්වරය කුමක්ද? 1. <u>ග</u> 2. <u>නි</u> 3.<u>ධ</u> 4. <u>රි</u>

10. A Major කෝඩ් එක සඳහා යොදන ස්වර බටහිර ක්‍රමයට ලියූ විට

1. A C# E 2. A E^b D 3. A C E 4. A D G

11. A Major කෝඩ් එක පිහිටන්නේ ගිටාරයේ කීවෙනි Fret එක මතද?

1. 1St Fret 2.2Nd Fret 3. 3Rd Fret 4. 4Th Fret

12.වම් අත ඇඟ ගිටාර් වාදනයේදී යොදාගන්නා අංක පිළිවෙල නම් කරන්න.

13.E^m D^m C^m මෙම කෝඩ්ස් 3හි ස්වර පෙරදිග සහ අපරදිග ක්‍රමයට ලියන්න.

14.D Major G Major A Major මෙම කෝඩ්ස් 3 Fret board 3ක් ඇඳ නම් කරන්න.

15. D Major G Major A Major මෙම කෝඩ්ස් වලට අදාළ ස්වර බටහිර ක්‍රමයට ලියන්න.

විෂයය :- පෙරදිග සංගීතය	ශ්‍රේණිය :- 9
පාඩම / ඒකකය :- ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය	
ගුරුවරයාගේ නම :- ටී.ඒ.කේ.ගායත්‍රී	පාසල :- අම්/ගාමිණී මහා විද්‍යාලය

ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය

සිංහල කණ්ඩායම් ගීයේ නිර්මාතෘවරයා දක්ෂ ගිටාර් වාදන ශිල්පී නෙවිල් ප්‍රනානදු ලෙස පිළිගැනේ.කණ්ඩායම් ගීත 1964 සිට ජනප්‍රිය විය.ස්පාඤ්ඤ සංගීතයේ ආශ්‍රය ලැබී ඇත.ගී තනු සීමිත ස්වර පරාසයකින්නිර්මාණ වී ඇත.එකම තනුව නැවත නැවත ඇසේ.නර්තනශීලී රිද්ම ලක්ෂණයක් ඇත.කෝඩ් දෙකක් හෝ තුනක් හෝ මත තනු නිර්මාණය කර ඇත.සුසංවාද (හාර්මනි) ක්‍රමය භාවිත කර ඇත.එකල බොහෝ වියතුන් කණ්ඩායම් සංගීතය විවේචනය කළද ෂෙල්ටන් ප්‍රේමරත්න සංගීතඥයා එය සමාජීය අවශ්‍යතාවක් ලෙසට අගය කර ඇත.

භාවිතා කළ සංගීත භාණ්ඩ :- ස්පැනිෂ් ගිටාර්,ගයිරෝ,මර්කාස් කොංගෝ ඩ්‍රම්ස්,බොංගෝ ඩ්‍රම්ස්,වයලින්

ශ්‍රී ලංකාවේ මුල්ම ගායක කණ්ඩායම් දෙකකි.එනම් ලොස් කැබෙලරෝස් සහ

ලා සිලනියෝස් යන කණ්ඩායම් දෙකය.

ලා සිලනියස් ගායක කණ්ඩායම - බතික් සරම සමග අත් කොට තද පැහැති කමිසයක් ඇඳ පන්කොළ තොප්පියක් දැමූ ඇඳුමක් භාවිතා කර ඇත.නායක නොයෙල් බ්‍රයන් රණසිංහ සමග සාමාජික සංඛ්‍යාව හයකි.

ප්‍රචලිත ගීත :- හොයියා හෝයියා , එක්සත් වී භේද නසා , තරුණ ජීවිතේ අපේ විනෝදයෙන්

ලොස් කැබෙලරෝස් කණ්ඩායම

නායක නෙවිල් ප්‍රනාන්දු

මල් බර හිමිදිරියේ

ප්‍රචලිත ගීත ;- මගෙ සුදු මාමේ (සී.ටී.ප්‍රනාන්දු සමග)

උඩරට මැණිකේ මනහර (සී.ඩී.ෆොන්සේකා,රසීනා යකීම් සමග)

ලස්සන රත්තරන් බබෝ,

පුන්සඳ හිනැහෙනේනේ,සඳක් නැගී සඳක් ගිලේ සාගරේ,මැණිකේ ඔබෙ සිනාවේ (රුක්මණී දේවි සමග)

60-70 දශකය තුළ මෙරට බිහි වූ වෙනත් කණ්ඩායම් කිහිපයක්

මූන්ස්ටෝන් (රුවන් පුරේ අපේ ගම තමයි,මංගෝ කළු නැන්දේ,මැණිකේ සුදු මැණිකේ)

ලා බම්බාස් (එන්න යන්න නෙළුම් විලේ නෙළුම් කඩන්න,කළේ උකුලෙ තියාලා)

ත්‍රී සිස්ටර්ස් (වන දෙව් ලිය තුරුලේ, ඔබ සොයනා කළු කෙල්ල මමයි)

ජිප්සීස් (පාවෙන පිරිසියක් උඩ නැගලා,දැන දැන වැරදි,ඕවත් වැඩද)

සුපර් ගෝල්ඩන් චයිම්ස් (කඳ සුරිඳුනි ඔබෙ,මුව හසරැලි සාගරේ)

ධර්මරත්න බ්‍රදර්ස් (හෝ වැස්ස වහිනවා) මී මැස්සෝ (මුළු ගතම වෙහෙසුණා), සමනලයෝ

ලොස් ෆ්ලෙමින්කෝස් (කළු කෙල්ලේ ඔබ හරිම හැඩයි)

පසු කාලීනව කණ්ඩායම් සංගීතය මගින් ජනප්‍රිය වූ වාග්ගේයකරයෙකු (ගීත ප්‍රබන්ධකයෙක් මෙන්ම තනු නිර්මාණ කරුවෙක්) ලෙස ක්ලැරන්ස් විජේවර්ධන හැඳින්විය හැකිය.ගීත - මලට බඹරෙකු සේ,කඳ සුරිඳුනි ඔබෙ,කාගෙද ගොන් වස්සා,කිමද නාවේ,දිල්හානී දුවනි,ගමෙන් ලියුමක් ඇවිල්ලා

අංක 1 – 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.

01.ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතයේ පුරෝගාමියා වන්නේ,

1.ක්ලැරන්ස් විජේවර්ධන 2.නෙවිල් ප්‍රනාන්දු 3.නොයෙල් රණසිංහ 4.සී.ටී.ප්‍රනාන්දු

02.කණ්ඩායම් සංගීතය සඳහා ආභාසය ලැබී ඇත්තේ,

1.ස්පාඤ්ඤ සංගීතයෙනි. 2.බටහිර සංගීතයෙනි 3.කපිරිඤ්ඤා සංගීතයෙනි. 4.චීන සංගීතයෙනි.

03.කණ්ඩායම් සංගීතය සඳහා භාවිතා කරන සංගීත භාණ්ඩයක් නොවන්නේ,

1.ස්පැනිෂ් ගිටාර් 2.කොංගෝ 3.බොංගෝ 4.තබ්ලා

04.කණ්ඩායම් සංගීතයෙහි ලක්ෂණයක් නොවන්නේ මේ අතරින් කුමක්ද?

1.එකම තනුව නැවත නැවත ඇසීම. 2.නර්තනශීලී රිද්මයක් තිබීම.

3.හාර්මනි භාවිතා කර තිබීම. 4.ගී තනු පුළුල් ස්වර පරාසයක විහිදී තිබීම.

05.ශ්‍රී ලංකාවේ මුල්ම ගායක කණ්ඩායමක් වන්නේ,

1.මී මැස්සෝ 2.ජිප්සීස් 3.ලොස් කැබලරෝස් 4.ත්‍රී සිස්ටර්ස්

06.ලොස් කැබෙලරෝස් නම් ලංකාවේ මුල්ම සංගීත කණ්ඩායමේ නායකයා වන්නේ,

1.නොයෙල් රණසිංහ 2.නෙවිල් ප්‍රනාන්දු 3.බ්‍රයන් රණසිංහ 4.ක්ලැරන්ස් විජේවර්ධන

07.ලොස් කැබෙලරෝස් කණ්ඩායමේ ගීතයක් වන්නේ,

1.හොයියා හෝයියා 2.මංගෝ කළු නැන්දේ 3.මල් බර හිමිදිරියේ 4.කාගෙද ගොන් වස්සා

08.ලා සිලනියස් කණ්ඩායමේ ගීතයක් වන්නේ,

1.සඳක් නැගී සඳක් ගිලේ 2.හොයියා හෝයියා 3.වන දෙව්ලිය තුරුලේ 4.උඩරට මැණිකේ

09.ක්ලැරන්ස් විජේවර්ධන මහතා විසින් ගායනා කළ ගීතයක් වන්නේ,

1.කාගෙද ගොන් වස්සා 2.මල් බර හිමිදිරියේ 3.මැණිකේ ඔබේ සිනාවේ 4.මගෙ සුදු මාමේ

10. 60 -70 දශකය තුළ ශ්‍රී ලංකාවේ බිහි වූ කණ්ඩායමක් වන්නේ,

1.ලොස් කැබෙලරෝස් 2.ලා සිලනියස් 3.මාරිම්බා 4.ජිප්සීස්

11. ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතයේ ආරම්භය පිළිබඳ ඔබ දන්නා කරුණු 03 ක් ලියන්න.

12. කණ්ඩායම් සංගීතයේ ලක්ෂණ 05 ක් ලියා දක්වන්න.

13. ශ්‍රී ලංකාවේ මුල්ම ගායක කණ්ඩායම් දෙක නම් කර ඉන් එක් කණ්ඩායමක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

14. 60 – 70 දශකය තුළ ලංකාවේ බිහි වූ සංගීත කණ්ඩායම් 05 ක් නම් කර ඒ එක් එක් කණ්ඩායම විසින් ගායනා කරන ලද ගීතයක් බැගින් නම් කරන්න.

15. ක්ලැරන්ස් විජේවර්ධනයන් විසින් නිර්මාණය කොට ගායනා කළ ගීත 03 ක් නම් කරන්න.

විෂය :- පෙරදිග සංගීතය 9 ශ්‍රේණිය
පාඩම/ඒකකය :- සපයා ගත හැකි අවනද්ධ භාණ්ඩයක් ආශ්‍රයෙන් මාත්‍රා 2, 3, 4 සහ මිශ්‍ර තාල හා සරල රිද්ම රටා වාදනය.
ගුරුවරයාගේ නම :- ඊ.ඒ. එදිරිසිංහ, කලාප අධ්‍යාපන කාර්යාලය, අම්පාර.

අතින් තාල පෙන්වීමෙදී හින්දුස්ථානී තාල සහ දේශීය තිත්රූප සඳහා ආකාර දෙකක් ඇත. හින්දුස්ථානී තාල පදවලදී තාලයේ ඇති මාත්‍රා විභාගයෙන් විභාගය වෙන් වශයෙන් දක්වනු ලබයි.

X - සමග්‍රහය - ඇති ස්ථාන වලට අත්පුඩි ගසන්න.

2, 3 - අනුතාලස්ථාන - ඇති ස්ථානවලදී අත්පුඩි ගසන්න.

O - ඛලි - ස්ථානය සඳහා අත ඉවතට දැක්වීම.

විභාගයේ ඉතිරි මාත්‍රා සඳහා සුළැඟිල්ල පැත්තේ සිට සුළැඟිල්ල, වෙදඟිල්ල, මැදඟිල්ල තබා මාත්‍රා දැක්වීම.

ඣප් තාලය

මාත්‍රා	1 2	3 4 5	6 7	8 9 10
ඨේකාව	ධි න	ධි ධි න	ති න	ධි ධි න
තාල සංඥා	X	2	O	3

ඣප් තාලයේ මාත්‍රා යෙදෙන්නේ එක් විභාගයක මාත්‍රා දෙක සහ මාත්‍රා තුන බැගින් ය. මෙසේ යෙදෙන මාත්‍රා දෙක සහ තුන එක්වී එක් විභාගයක මාත්‍රා 5ක් වශයෙන් යෙදෙන බටහිර සංගීතයේ තාල 5/4 Rhythm ලෙස හඳුන්වයි. 5/8 Rhythm වශයෙන් ගැනෙන්නේද, එක් විභාගයක මාත්‍රා 5 බැගින් යෙදෙන, වේගයෙන් වැයෙන තාල වේ.

දීප්චන්දි තාලය

මාත්‍රා	1 2 3	4 5 6 7	8 9 10	11 12 13 14
ඨේකාව	ධ ධිං -	ධ ධ ධිං -	ත තිං -	ධ ධ ධිං -
තාල සංඥා	X	2	O	3

දීප්චන්දි තාලයේ මාත්‍රා යෙදෙන්නේ එක් විභාගයක මාත්‍රා තුන සහ අනෙක් විභාගයේ මාත්‍රා හතර බැගින් ය. මෙසේ යෙදෙන මාත්‍රා තුන සහ හතර එක්වී එක් විභාගයක මාත්‍රා 7ක් වශයෙන් යෙදෙන බටහිර සංගීතයේ තාල 7/8 Rhythm ලෙස හඳුන්වයි.

මෙම තාලවලට අමතරව අවනද්ධ වාද්‍ය භාණ්ඩ (තාල වාද්‍ය භාණ්ඩ) වාදනය සඳහා නිර්මාණාත්මක රිද්ම රටා යොදාගත හැක. රිද්ම රටා සඳහා අත්පුඩි ගැසීම, පොල්කටු තට්ටු කිරීම, ලී කැබලි එකට ගැසීම ආදිය ද කල හැක. රිද්ම රටාවලදී සෑම විභාගයකදීම පලමු, දෙවන, තෙවැනි , සිව්වැනි මාත්‍රා නිසි පරිදි වෙන්කර දැක්වීමට හඬ අඩු වැඩි කර වාදනය කළ යුතුය. කතිර " X " ඇති ස්ථාන සඳහා අත්පුඩිය ද "–" ඇති ස්ථාන සඳහා නිහඬව මාත්‍රාව දැක්වීමද හුරුවිය යුතුය.

මාත්‍රා 2 සහ 3 රිද්ම රටා

| X X | X X X | X X | X X X |

| X X | X X - | X X | X X - |

| X X | X – X | X X | X – X |

| X - | X X X | X - | X X X |

| X - | X X - | X - | X X - |

| X - | X - X | X - | X - X |

මාත්‍රා 3 හා 4 රිද්ම රටා

| X X X | X X X X | X X X | X X X X |

| X X X | X – X - | X X X | X - X - |

| X X X | X X X - | X X X | X X X - |

| X X X | X - X X | X X X | X - X X |

| X - X | X X X X | X – X | X X X X |

| X - X | X - X - | X - X | X X X X |

| X - X | X - X - | X - X | X - X - |


බොන්ගො

ටැම්බරින්

දර්බග්


කහෝන්


කොංගො

බටහිර තාල සහ රිද්ම රටා වාදනය කිරීම සඳහා භාවිතා කළ හැකි වාද්‍ය භාණ්ඩ කිහිපයක්

ඇගයීම

1) ඝඩප් තාලයේ මාත්‍රා ගණන
   - i. 6 කි
   - ii. 10 කි
   - iii. 16 කි
   - iv. 8 කි

2) දාදරා තාලයේ බලි ස්ථානය පිහිටන්නේ,
   - i. පළමු මාත්‍රාවේය.
   - ii. තුන්වන මාත්‍රාවේය.
   - iii. හතරවැනි මාත්‍රාවේය.
   - iv. දෙවැනි මාත්‍රාවේය.

3) දීප්වන්දි තාලයේ සම්පූර්ණ මාත්‍රා ගණන,
   - i. 10 කි
   - ii. 12 කි
   - iii. 8 ක
   - iv. 14 කි

4) ඝඩප් තාලයට සමානව මාත්‍රා කැටිවන දේශීය තිත්රූපය
   - i. සුළු තනි තිත
   - ii. මැදුම් මහ දෙතිත
   - iii. සුළු මැදුම් දෙතිත
   - iv. මහ තනි තිත

5) X X - | X X X X | X X - | X X X X | මෙම රිද්ම රටාව අනුව මාත්‍රා කැටිවන හින්දුස්ථානි තාලය,
   - i. කෙහෙර්වා තාලය
   - ii. ඝඩප් තාලය
   - iii. දීප්වන්දි තාලය
   - iv. ත්‍රිතාලය

6) මාත්‍රා දෙක සහ තුන වශයෙන් මාත්‍රා කැටිවන තාල සඳහා බටහිර සංගීතයේ භාවිතාවන තාල වන්නේ,
   - i. 4/4 Rhythm
   - ii. 3/4 Rhythm
   - iii. 6/8 Rhythm
   - iv. 5/4 Rhythm

7) මාත්‍රා තුන සහ හතර වශයෙන් විභාග වෙන්වන තාලරූප බටහිර සංගීතයේ නම් කරන්නේ,
   - i. 5/8 Rhythm
   - ii. 3/4 Rhythm
   - iii. 4/4 Rhythm
   - iv. 7/8 Rhythm

8) මාත්‍රා තුන සහ හතර වශයෙන් මාත්‍රා කැටිවන තාල රූප සඳහා සැසඳෙන තිත් රූපය වන්නේ,
   - i. සුළු මැදුම් දෙතිත
   - ii. මහ තනි තිත
   - iii. මැදුම් මහ දෙතිත
   - iv. සුළු මැදුම් දෙතිත

9) දෙමන් සහ තුන්මන් කැටි රිද්ම රටාවක් ලෙස ගත හැකිය.
   - i. | + + | + + - | + + | + + - |
   - ii. | + - - | + + + + | + - - | + + + + |
   - iii. | + + + + | + + + + | + + + + | + + + + |
   - iv. | + + | + + | + + | + + |

10) බටහිර තාල වාද්‍ය භාණ්ඩ සඳහා නිදසුනක් ලෙස ගත හැකි පිළිතුර වන්නේ
   - i. තබ්ලාව
   - ii. ගැට බෙරය
   - iii. Congo
   - iv. ඩෝලය

11) ඝඩප් තාලය නියමිත තාලසංඥා සහිතව ප්‍රස්ථාර කරන්න.
12) දීප්වන්දි තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.
13) මාත්‍රා දෙක, තුන කැටිවූ රිද්මරටා 5ක් නිර්මාණය කරන්න.
14) මාත්‍රා 3, 4 කැටිවූ රිද්මරටා 5ක් නිර්මාණය කරන්න.
15) සුලු මැදුම් දෙතිත සහ මැදුම් මහ දෙතිත නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.

විෂය :- පෙරදිග සංගීතය ශ්‍රේණිය :- 9 ශ්‍රේණිය

පාඩම/ඒකකය :- අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය

ගුරුවරයාගේ නම :- එන්. කේ. ඩී. සුභද්‍රා කුමාරි පාසල :- අම්/රජගලතැන්න මහා විද්‍යාලය

ලොව පුරා ප්‍රචලිත වූත්, බහුල ලෙස භාවිතා කරන්නා වූත් සංගීත ක්‍රමය ලෙස අපරදිග (බටහිර) සංගීත ක්‍රමය හැඳින්විය හැකිය. මෙය වාදනය ප්‍රමුඛ සංගීත සම්ප්‍රදායක් බව විද්වත් මතයයි. මෙම සංගීත පද්ධතියෙහි සංගීත භාණ්ඩ විශාල ප්‍රමාණයක් භාවිතා වේ.

බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණය,

ප්‍රධාන වශයෙන් කොටස් තුනක් යටතේ වර්ග කල හැකිය.

1. තත් සංගීත භාණ්ඩ (String Instruments)
2. සුෂිර සංගීත භාණ්ඩ (Wind Instruments)
3. සමාඝාත සංගීත භාණ්ඩ (Percussion Instruments)

තත් සංගීත භාණ්ඩ:- තන්තු සහිතව නිර්මාණය කර ඇති වාද්‍ය සංගීත භාණ්ඩ වේ. ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. ඒවා නම්, අලවකින් වයන (Bowing) හා නියගින් හෝ පික් එකකින් වයන (Plucking). තත් සංගීත භාණ්ඩ කිහිපයක් පහත දැකිවේ.

Bowing - අළුවකින් වයන	Plucking - නියගින් හෝ පික් එකකින් වයන
Violin - වයලීන් Viola - වියෝලා	Guitar - ගිටාර් Mandolin - මැන්ඩලීන්
Cello - චෙලෝ Double bass - ඩබල් බේස්	Banjo - බැංජෝ





සුෂිර සංගීත භාණ්ඩ:- සුළං භාවිතා කරමින් වාදනය කරන සංගීත භාණ්ඩ වේ. ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. ඒවා නම්, දැවමය සුෂිර (Wood wind) හා ලෝහමය සුෂිර (Brass Wind).

දැවමය කොටස් උපයෝගී කර ගෙන සුළං ආධාරයෙන් හඬ නිපදවන සංගීත භාණ්ඩ දැවමය සුෂිර (Wood wind) භාණ්ඩ වේ.

Single reed - ඉපියා එකක් සහිත සුෂිර භාණ්ඩ

Double reed - ඉපියා දෙකක් සහිත සුෂිර භාණ්ඩ
Reed less - ඉපියා රහිත

ලෝහමය කොටස් උපයෝගී කර ගෙන සුළං ආධාරයෙන් හඬ නිපදවන සංගීත භාණ්ඩ ලෝහමය සුෂිර (Brass wind) භාණ්ඩ වේ.

දැවමය සුෂිර - **Wood wind**	ලෝහමය සුෂිර - **Brass Wind**
Single reed Clarinet - ක්ලැරිනට් Saxophone - සැක්සෆෝන් Double reed Oboe - ඔබෝ Cor-angalis - කොරැන්ගලීස් Bassoon - බැසූන් Reed less Flute - ෆ්ලූට් Piccolo - පිකලෝ	Trumpet - ට්‍රම්පට් Trombone - ට්‍රොම්බෝන් Tuba - ටියුබා French Horn - ෆ්‍රෙන්ච් හෝන් Baritone - බැරිටෝන්



සමාඝාත සංගීත භාණ්ඩ:- තැලීමෙන් සෙලවීමෙන් නාදය උපදවා ගන්නා භාණ්ඩ වේ. ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. ඒවා නම්, ස්වර භාණ්ඩ (Definite pitch) හා තාල වාද්‍ය(In Definite) වේ. එම සංගීත භාණ්ඩ කිහිපයක් පහත දැක්වේ.

ස්වර භාණ්ඩ(**Definite pitch**)	තාල වාද්‍ය(**In Definite**)
Glockenspiel - ග්ලොකන්ස්පීල් Vibro Phone - වයිබ්‍රෝ ෆෝන් Xylo Phone - සයිලෝ ෆෝන්	Bass Drum - බේස් ඩ්‍රම් Side Drum - සයිඩ් ඩ්‍රම් Tenor Drum - ටෙනර් ඩ්‍රම් Cymbol - සිම්බල් Triangle - ට්‍රැන්ගල් Tambourine - ටැම්බරින්





බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණය පහත පරිදි වේ.



බටහිර සංගීත භාණ්ඩ අතරින් පාසල් පද්ධතියේ භාවිතා වන භාණ්ඩ රාශියක් පාසල් තූර්ය වාදක කණ්ඩායම් වල භාවිතා වේ. ඉන් කිහිපයක් පහත සඳහන් වේ.

Trumpet, Baritone, Trombone, Sousaphone, Tuba, Clarinet, Flute/Piccolo, Side Drum or Snare Drum, Tenor Drum

කාර්යය පත්‍රිකාව : -

අංක 1 – 5 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත රූප සටහන් උපයෝගී කර ගන්න.



(A) Saxophone (B) Flute (C) Tuba (D) Bassoon

1. Wood wind – Double reed සංගීත භාණ්ඩය වන්නේ,

(i) A (ii) B (iii) C (iv) D

2. Wood wind – Single reed සංගීත භාණ්ඩය වන්නේ,

(i) A (ii) B (iii) C (iv) D

3. Brass wind – Reed less සංගීත භාණ්ඩ යුගලය වන්නේ,

(i) A-B (ii) C-D (iii) C-B (iv) A-C

4. බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව මෙම භාණ්ඩ අයත් වන්නේ,

(i) String (ii) Wind (iii) Percussion (iv) Bowing

5. Wood wind instrument සංගීත භාණ්ඩය වන්නේ,

(i) ACD (ii) ABD (iii) ABC (iv) BCD

පහත දක්වා ඇති සංගීත භාණ්ඩ උපයෝගී කරගෙන අංක **6–8** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(ගිටාරය, වයලීනය, චෙලෝ, ඩබල් බේස්, වියෝලා)

6. ඉහත සංගීත භාණ්ඩ අතරින් අලුවකින් වාදනය නොකරන භාණ්ඩය .... වේ.

7. වයලීන් පවුලේ විශාලතම සංගීත භාණ්ඩය .... වන අතර .... කුඩාම වේ.

8. වාදනය කරන ඉරියව්ව වයලීනයට ඉතාමත් සමීප වාද්‍ය භාණ්ඩය .... වේ.

අංක **9 – 10** ප්‍රශ්න වල දැක්වෙන ප්‍රකාශ වැරදිය. ඒවා නිවැරදි කර ලියන්න.

9. පාසල් තූර්ය වාදක කණ්ඩායම් වල භාවිතා වන Saxophone Percussion වර්ගයට අයත් වේ.

10. Xylophone, Glockenspiel භාණ්ඩ String වර්ගයට අයත් තාල වාද්‍ය භාණ්ඩයන්ය.

අංක **11–14** ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

11. බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

12. වයලීන් පවුලේ සංගීත භාණ්ඩ නම් කර වයලීනයක් ඇද කොටස් නම් කරන්න.

13. Harp, Glockenspiel, Double Bass, Cymbol, Bass Drum, Saxophone, Mandolin, Tuba, Side Drum, Piano, Trumpet, Guitar යන භාණ්ඩ අතරින් පාසල් තූර්ය වාදක කණ්ඩායම් වල භාවිතා වන භාණ්ඩ පෙළ ගස්වන්න.

14. Percussion වර්ගයට අයත් තාල වාද්‍ය භාණ්ඩ උදාහරණ දක්වමින් කෙටියෙන් විස්තර කරන්න.

15. පහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.



පහළට-

1. තත් භාණ්ඩ මේ නමින් වර්ග කරයි.
2. තන්ත්‍රිය වාද්‍ය භාණ්ඩයකි.

හරහට-

1. ලෝහමය සුෂිර වාද්‍ය භාණ්ඩයකි.
2. සුෂිර වාද්‍ය භාණ්ඩ මේ නමින් වර්ග කරයි.
3. සුෂිරමය ඉපියා දෙකක් සහිත භාණ්ඩයකි.

විෂය - සංගීතය ශ්‍රේණිය 9

පාඩම් ඒකකය 8-1 ක්‍රියාකාරකම - Sharp , flat , Natural Marks

ගුරුභවතාගේ නම - W.M ලලිත් වීරසිංහ T.p 077-6560244

පාසල අම් / කරංගාව ජනරජ විද්‍යාලය

ක්‍රියාකාරකම

Sharp , flat , Natural Marks

බටහිර සංගීතයේ ප්‍රස්තාර ක්‍රමයේ සංකේත රාශියක් භාවිතා වන අතර එම සංකේත වල විවිධ අදහස් වේ. පෙරදිග සංගීතයේ ස්වර ප්‍රස්තාරයක් බටහිර ක්‍රමයට පරිවර්තනය කිරීමට එම සංකේත වල අර්ථය නිවැරදිව වටහා ගත යුතුය . (පහත ප්‍රස්තාර අධ්‍යයනය කරන්න.)



Sharp Mark :- ♯

Sharp වීම යනු ඕනෑම ශුද්ධ ස්වරයක සිට අර්ධ ස්වරයක (Semi tone) හඬ වැඩිවීමයි. ස්වර පුවරුවක වම් පැත්තේ සිට දකුණු පැත්තට වාදනය කිරීමේ දී හමුවන සියලුම කලු ස්වර Sharp ස්වර ලෙස හැදින්වේ. පෙරදිග සංගීතයේ තිව්‍ර ම ස්වරය ද ශුද්ධ ම ස්වරයට වඩා අර්ධ ස්වරයක හඬ වැඩිය. එම ස්වරය බටහිරට පරිවර්තනය කිරීමේදී Sharp සලකුණ යොදයි.

ස - ම/ - / ග - - -



ම / = F ♯

Flat Mark :- ♭

Flat වීම යනු ඕනෑම ශුද්ධ ස්වරයක සිට අර්ධ ස්වරයක (Semi tone එකක)හඬ අඩු වීමයි. ස්වර පුවරුවක දකුණු පැත්තේ සිට වම් අතට වාදනය කිරීමේ දී ලැබෙන සියලු කලු ස්වර Flat ස්වර වේ . පෙරදිග සංගීතයේ කෝමල ස්වරවල හඬ ශුද්ධ ස්වරයට වඩා අර්ධ ස්වරයකින් හඬ අඩු වේ. එම ස්වර බටහිරට පරිවර්තනය කිරීමේ දී Flat සංකේතය යොදයි.

<u>රි</u> <u>ග</u> <u>ධ</u> <u>නි</u> = D^b $E^bA^bB^b$

ස <u>රි</u> <u>ග</u> - / <u>නි</u> - <u>ධ</u> ස /



Natural Mark :- ♮

Key Signature තුළ Flat හෝ sharp බවට පත්ව ඇති ස්වරයක් බවට කිරීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා Natural Mark යෙදිය යුතුය .

ස රි නි - / නි ම නි - .



01. ස්වරයක් Flat වීම යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද ?

02. පෙරදිග සංගීතයේ කෝමල ස්වරයක බටහිර ක්‍රමයට පරිවර්තනය කිරීමේ දී යොදන සංකේතය කුමක් ද ?

03. ස්වරයක් sharp වීම යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද ?

04. F # මෙම ස්වරය පෙරදිග ක්‍රමයට පරිවර්තනය කර ලියන්න .

05. ස්වර පුවරුවක් ඇඳ එහි sharp සහ Flat ස්වර ලකුණු කරන්න.

පහත ස්වර ප්‍රස්තාරය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



06. අංක 01න් දක්වා ඇති සංකේතය නම කුමක් ද ?

07. අංක 02න් හැඳින්වෙන සංකේතය කුමක් ද?

08. අංක 03න් හැඳින්වෙන සංකේතය කුමක් ද?

09. Natural සංකේතය භාවිතා කරනු ලබන්නේ කුමන අවස්ථාවේ දී ද?

10. ස රි ග - / නි ධ ම - / ග රි ග - / ම් ග ස -

ඉහත ස්වර ප්‍රස්තාරය බටහිර කුමයට පරිවර්තනය කරන්න .

විෂය - සංගීතය ශ්‍රේණිය 9

පාඩම් ඒකකය 8 1 +Clef / Tie Mark /Rest Mark

ගුරුභවතාගේ නම - W.M ලලිත් වීරසිංහ T. P -0776560244

පාසල - අම් / කරංගාව ජනරජ විද්‍යාලය

Clef – Clef යනු ස්වරයන්ගේ නියම තත්වය හඳුනා ගැනීම සහ බටහිර සංගීතයේ භාවිත කරනු ලබන සංකේතයයි . ඒවැනි Clef කිහිපයක් ඇති අතර එයින් අප Trebl Clef හා Bass Clef අධ්‍යයනය කරමු . key Board හා Piano වාදනයේ දී මෙම Clef දෙකට අදාළ ස්වර එකවර Read කිරීම සිදුවේ . මෙයින් පහළ ස්වර ලිවීම සඳහා Bass clef භාවිතා කරයි. මධ්‍ය ස්වර හා උච්ච ස්වර සඳහා Trable clef භාවිතා කරයි .



Rest Mark :-

බටහිර සංගීතයේ නිහඬ මාත්‍රා දැක්වීම සඳහා වෙන වෙන ම සංකේත භාවිතා කරයි .

සංකේතය	නම	නිහඬ මාත්‍රා සංඛ්‍යාව
	Semi Brave rest	04
	Minim rest	02
	Crotchet rest	01
	Quaver rest	$\frac{1}{2}$

Tie Mark

බටහිර සංගීතයේ එක් විභාගයකට අවසාන ස්වරයක ඊලඟ විභාගයේ මුල් ස්වරය වටිනාකම එක් කර ගැනීම සඳහා Tie (◡) සංකේතය යොදාගනී . පහත ප්‍රස්තාරය අධ්‍යයනය කරන්න.

ස රි ග - / - ස - - /



01. Clef සංකේතයෙන් අදහස් වන්නේ කුමක්ද ?

02. පෙරදිග සංගීතයේ මන්ද්‍ර හා අති මන්ද්‍ර ස්වර බටහිර ක්‍රමයට පරිවර්තනය කිරීමේ දී එයට ගැලපෙන Clef සංකේතය කුමක්ද ?

03. ග ම + / රි ධ - / + + ස

ඉහත ස්වර ප්‍රස්තාරයේ බටහිර ක්‍රමයට පරිවර්තනය කරන්න .

04. මාත්‍රා 04ක් නිහඬව සිටීම සඳහා බටහිර සංගීතයේ භාවිතා කරනු ලබන සංකේතයේ නම කුමක්ද ?

i Minim Rest   ii. Crotchet rest   iii. SemiBrave rest   iv . Quaver rest

05. පෙරදිග සංගීතයේ මධ්‍ය හා උච්ච ස්වර ඇතුලත් වන්නේ බටහිර සංගීතයේ කුමන Clef සංකේතයටද ?

පහත ප්‍රස්තාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



06. මාත්‍රා 02 ක් නිහඬ බව දක්වා ඇත්තේ කුමන අක්ෂරය ද?

07. මාත්‍රා 01ක් නිහඬ බව දක්වා ඇත්තේ කුමන අක්ෂරය ද?

08. C අක්ෂරයේ දක්වා ඇති සංකේතයේ නම සහ වටිනාකම ලියන්න .

09. Tie සංකේතය යොදනු ලබන්නේ කුමන අවස්ථාවකදීද ?

10. F Clef හා G Clef යනුවෙන් හඳුන්වන්නේ බටහිර සංගීතයේ කුමන Clef සංකේත දෙකද ?

විෂය :- පෙරදිග සංගීතය	9 ශ්‍රේණිය
පාඩම/ඒකකය :- C, F, G, B^b Scales (Major, Minor)	
ගුරුවරයාගේ නම :- ඊ.ඒ. එදිරිසිංහ, කලාප අධ්‍යාපන කාර්යාලය, අම්පාර.	

බටහිර සංගීතයේ ස්වර පරිමාණ තුලින් ගොඩ නැගෙන විවිධ සංගීත ශිල්ප ක්‍රම සඳහා පාදක කොටගෙන ඇත්තේ Semitone සහ Tone පරතර වේ. Semitone සහ Tone යනු ස්වර දොළස පිළිවෙලින් ගත් කල කිසියම් ස්වරයක සිට යාබද අනෙක් ස්වරයට ඇති පරතරය Semitone වන අතර Semitone දෙකක පරතරය Tone එකක් වේ.

උදාහරණ :-

ස රි̲ රි ග̲ ග ම́ ම ප ධ̲ ධ නි̲ නි ස̇

S.T. S.T. S.T. S.T. S.T. S.T. S.T. S.T. S.T. S.T. S.T. S.T.

Tone Tone Tone

Semitone සහ Tone පරතර පාදක කොටගෙන ගොඩනගන ස්වර 8කින් යුත් ස්වර මාලාවක් Scale නමින් හැඳින්වේ. Scale වර්ග ගණනාවක් ඇති අතර එයින් Major Scale සහ Minor Scale මුලින් අපි අධ්‍යයනය කිරීම වැදගත් වේ.

C මේජර් ස්කේල් සඳහා යෙදෙන ටෝන් සෙමිටෝන් ස්වර පරතරයන් හඳුනා ගන්න.

ස	රි̲	රි	ග̲	ග	ම	ම́	ප	ධ̲	ධ	නි̲	නි	ස̇	රි̲̇	රි̇	ග̲̇	ග̇	ම̇
ස		රි		ග	ම		ප		ධ		නි	ස̇					

Tone Tone Semitone Tone Tone Tone Semitone

මධ්‍ය ස ස්වරයේ සිට උච්ච ස දක්වා ස්වර 8 තුළ Semitone සහ Tone පරතරය යෙදී ඇති අයුරු පැහැදිලිය. මේ ආකාරයටම පරතරය තබා ඕනෑම ස්වරයක් පාදක කොටගෙන Major Scale සකස් කරගත හැකිය. Minor scale කිහිප වර්ගයක් ඇති අතර; ඒවාට ද නිශ්චිත tone,Semitone පරතරයන් ඇත.

ඒ අනුව F Major Scale එක තුළ Semitone සහ Tone ස්වර පරතර යෙදෙන අයුරු බලන්න

ස	රි̲	රි	ග̲	ග	ම	ම́	ප	ධ̲	ධ	නි̲	නි	ස̇	රි̲̇	රි̇	ග̲̇	ග̇	ම̇
					ම		ප		ධ	නි̲		ස̇		රි̇		ග̇	ම̇

Tone Tone Semitone Tone Tone Tone Semitone

<u>Major Scale කිහිපයක්</u>

C Major Scale														
1	2	3	4	5	6	7	8	9	10	11	12	1	2	3
ස		රි		ග	ම		ප		ධ		නි	ස̇		
F Major Scale														
1	2	3	4	5	6	7	8	9	10	11	12	1	2	3
ම		ප		ධ	නි̲		ස		රි		ග	ම		
G Major Scale														
1	2	3	4	5	6	7	8	9	10	11	12	1	2	3
ප		ධ		නි	ස̇		රි̇		ග̇		ම́̇	ප̇		
Bb Major Scale														
1	2	3	4	5	6	7	8	9	10	11	12	1	2	3
නි̲		ස		රි	ග̲		ම		ප		ධ	නි̲		

Natural Minor Scale (නැචුරල් මයිනර් ස්කේල්)

C Minor Scale														
1	2	3	4	5	6	7	8	9	10	11	12	1	2	3
ස		රි	ග		ම		ප	ධ		නි		ස		
F Minor Scale														
1	2	3	4	5	6	7	8	9	10	11	12	1	2	3
ම		ප	ධ		නි		ස	රි		ග		ම		
G Minor Scale														
1	2	3	4	5	6	7	8	9	10	11	12	1	2	3
ප		ධ	නි		ස		රි	ග		ම		ප		
Bb Minor Scale														
1	2	3	4	5	6	7	8	9	10	11	12	1	2	3
නි		ස	රි		ග		ම		ප	ධ		නි		

මෙම ස්කේල් අතරින් මේජර් ස්කේල් 4 සහ මයිනර් ස්කේල් 4 බටහිර ක්‍රමයට ස්වර ප්‍රස්තාර කරන අයුරු සළකා බලමු. මෙහිදී කෝමළ, තීව්‍ර ස්වර සංකේත යොදාගන්නා ආකාර 2ක් ඇත. ඉන් එක ක්‍රමයක් වන්නේ ස්වරය අසල ම ස්වරයට ඉදිරියෙන් කෝමළ හෝ තීව්‍ර ස්වර සංකේතය යෙදීමයි.

C Major Scale (කෝමළ, තීව්‍ර ස්වර නොමැත)



C D E F G A B C
ස රි ග ම ප ධ නි ස

F Major Scale (නි යෙදේ)

F G A B^b C D E F
ම ප ධ නි ස රි ග ම

G Major Scale (ම් යෙදේ)



G A B C D E F# G
ප ධ නි ස රි ග ම් ප

B^b Major Scale (ග නි යෙදේ)

B^b C D E^b F G A B^b
නි ස රි ග ම ප ධ නි

C Natural Minor Scale (ග ධ නි යෙදේ)

C D E^b F G A^b B^b C
ස රි ග ම ප ධ නි ස

F Natural Minor Scale (රි ග ධ නි යෙදේ)

F G A^b B^b C D^b E^b F
ම ප ධ නි ස රි ග ම

G Natural Minor Scale (ග නි යෙදේ)

G A B^b C D E^b F G
ප ධ නි ස රි ග ම ප

ඇගයීම

1) C Major Scaleහි යෙදෙන ස්වර සියල්ල,
   I. ශුද්ධ වේ. කෝමල වේ. තීව්‍ර වේ. ශුද්ධ හා කෝමල වේ.

2) බටහිර සංගීතයේ Scaleවල ස්වර පරිමාණ සකස් කිරීමට පාදක කොටගෙන ඇත්තේ,
   I. Flat notes ය. II.Tone හා Semitone පරතරයන් ය. III. Key Signature ය. IV. Time Signature ය.

3) Major Scale එකක ස්වර අතර නිවැරදි Semitone සහ Tone පරතරය වන්නේ,
   I. T. , T. , T. , S.T. , T. , T. , T. II. S.T. , T. , T. , T. , S.T. , T. , T.
   III. T. , T. , T. , T. , S.T. , T. , T. IV. T. , T. , S.T. , T. , T. , T. , T.

4) ම ප ධ නි ස් රි ග් ම් (F G A B C D E F) යනුවෙන් දැක්වෙන්නේ,
   I. F major Scale ය. II. C Major Scale ය. III. G Major Scale ය. IV. B^b Major scale ය.

5) G major Scaleහි විකෘති ස්වරය වන්නේ,
   I. $F^\#$ වේ. II. E^b වේ. III. A^b වේ. IV. B^b වේ.

6) G major Scaleයට අයත් ස්වර කාණ්ඩය වන්නේ,
   I. ස රි ග ම ප ධ නි ස් II. රි ග ම ප ධ නි ස් රි් III. ම ප ධ නි ස් රි් ග් ම් IV. ප ධ නි ස් රි් ග් ම් ප්

7) C Natural minor scale සඳහා යෙදෙන විකෘති ස්වර වන්නේ,
   I. $E^b A^b B^b$ II. $F^\# A^b B^b$ III. $E^b A^b$ IV. $E^b B^b$

8) B^b Major Scale හි හතරවන ස්වරය වන්නේ,
   I. E^b (ගු) II. B^b (නි) III. F (ම්) IV. G (ප)

9) G Natural Minor Scaleහි යෙදෙන විකෘති යුගල වන්නේ,
   I. $B^b D^b$ (නි රි) II. $D^b E^b$ (රි ගු) III. $E^b A^b$ (ගු ධ) IV. $B^b E^b$ (නි ගු)

10) F natural Minor Scaleහි ඇතුලත් ස්වර අතරින්,
   I. ධ A^b , නි B^b ස්වර පමණක් කෝමල වේ. II. ම් $F^\#$ ස්වර පමණක් තීව්‍ර වේ. III. $A^b B^b D^b E^b$ කෝමල වේ. IV. නි B^b පමණක් කෝමල වේ.

11) Scale යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
12) F natural Minor Scaleය බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරන්න.
13) C Major Scale බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරන්න.
14) කැමති Major Scaleයක් හා Minor Scaleයක් තෝරාගෙන දෙකෙහි වෙනස Semitone හා Tone මගින් පහදන්න.
15) ප්‍රකෘති, විකෘති ස්වර දොළස අනුපිළිවෙලට ගෙන C Major Scaleහි ඇති ස්වර පරතරය අනුව D(රි) ස්වරයෙන් Major Scaleයට අයත් ස්වර 8 ලියන්න.

බටහිර රිද්ම රටා පෙන්වන නිදර්ශන

(පෙරදිග සංගීතයේ මාත්‍රා 2,3 රිද්ම රටා)



1 2 3 4 5

1 2 3 , 1 2



1 2 3 4 5

1 2 , 1 2 3

(පෙරදිග සංගීතයේ මාත්‍රා 3,4 රිද්ම රටා)



1 2 3 4 5 6 7

1 2 , 1 2 3 , 1 2



1 2 3 4 5 6 7

1 2 , 1 2 , 1 2 3



1 2 3 4 5 6 7

1 2 3 , 1 2 , 1 2

විෂය - සංගීතය	ශ්‍රේණිය 9
පාඩම් ඒකකය-8 1 ක්‍රියාකාරකම :- Time signature	
ගුරුභවතාගේ නම:- W . M ලලිත් විරසිංහ	T.p -0776560244
පාසල- අම්/ කරංගාව ජනරජ විද්‍යාලය	

❖ Time signature යනුවෙන් හඳුන්වනු ලබන්නේ බටහිර ප්‍රස්තාරයක කාලය හඟවන සංකේතයයි . මෙයින් එක් බාර් එකක් තුල තිබිය යුතු ස්වර සංඛ්‍යාව හගවයි. මෙහි ඉහළ ඉලක්කමෙන් ප්‍රමාණයද (Quantity) පහළ ඉලක්කමෙන් වර්ගයද (Quality) සඳහන් කරයි.

❖ Quantity → 3   6 2 3 2 3

❖ Quality → 4   8, 4 , 4, 2, 8

පහල ඉලක්කම 4 නම් crotchet වලින් ගණනය කල යුතුය . 8 නම්(Quaver) වලින් ගණනය කල යුතුය . පහල ඉලක්කම 2 නම් minim වලින් ගණනය කළ යුතුය . පහළ ඉලක්කමේ වර්ගයෙන් ඉහළ ඉලක්කමේ ප්‍රමාණය එක් bar එකක් තිබිය යුතුය .



Time Signature

$\frac{4}{4}$ පෙරදිග සංගීතයේ කෙහෙරවා තාලයට සමාන වේ .

$\frac{3}{4}$ පෙරදිග සංගීතයේ දාදරා තාලයට සමාන වේ .

$\frac{6}{8}$ - පෙරදිග සංගීතයේ ඛෙම්ටෝ තාලයට සමානකමක් දක්වයි .

01. බටහිර සංගීත ස්වර ප්‍රස්ථාර වල කාලය හඟවන සංකේතයේ නම කුමක් ද ?

02. දාදරා තාලය සමාන වන බටහිර තාල සංකේතය ලියා දක්වන්න .

03. $\frac{4}{4}$ මෙම Time signature එකෙහි පහළ ඉලක්කමෙන් හඳුන්වන ස්වර වර්ගය කුමක්ද?

04.

ඉහත ප්‍රස්තාරයට ගැලපෙන Time signature එක යොදන්න .

05. සරිස / ග- ග / රිගරි / ස- ග / මෙම ස්වර ප්‍රස්තාරයේ බටහිර ක්‍රමයට පරිවර්තනය කර Time signature යොදන්න

06.



ඉහත ප්‍රස්ථාරයට ගැලපෙන Time signature එක සඳහන් කරන්න .

07. එම ස්වර ප්‍රස්තාරය පෙරදිගට පරිවර්තනය කර එය අයත් කාලය නම් කරන්න.

ස ස ග ග / රි රි ග - / ස ස රි රි / ග - - -

08 ඉහත ස්වර ප්‍රස්තාරයට ගැලපෙන හින්දුස්ථානි කාලය නම් කරන්න.

09. එම ස්වර ප්‍රස්තාරය බටහිර ක්‍රමයට පරිවර්තනය කර Time signature එක යොදන්න .

10.



ඉහත Time signature එකට ගැලපෙන ස්වර ප්‍රස්තාරයක් (Bar 3ක්) ලියා දක්වන්න.

විෂය - සංගීතය ශ්‍රේණිය 9

පාඩම් ඒකකය-8 1 ක්‍රියාකාරකම :- Key signature

ගුරුභවතාගේ නම:- W . M ලලිත් වීරසිංහ T.p -0776560244

පාසල- අම්/ කරංගාව ජනරජ විද්‍යාලය

01. ක්‍රියාකාරකම- key signature

Key signature යනුවෙන් හඳුන්වනු ලබන්නේ බටහිර ප්‍රස්තාරයක Scale එක හදුනා ගැනීම සදහා යොදනු ලබන සංකේතයයි. මෙහිදි එක් එක් Scale එකට අනුව Sharp(තිව්‍ර) හෝ flat (කෝමල) සංකේත, වෙනස්ව යෙදේ. key signature එක යොදන ක්‍රම දෙකක් ඇත. එනම්,

1. With key signature – Clef සංකේතය සමග යෙදේ
2. Without key signature - අදාල ස්වරය අසලින් යෙදේ .

❖ With key signature යෙදීම එක්තරා පිළිවෙලකට අනුව සිදු කරයි.



C-Major-sharpහෝflat ලකුණු නොමැත.

G major Scale $F^{\#}$ = ම /



F major Scale B^{b} = නි



B^b major Scale B^b E^b = නි ග

❖ Without key signature එක යොදනු ලබන්නේ Scale එකට අයිති sharp (තීව්‍ර) හෝ flat (කෝමල) වන ස්වරය ප්‍රස්තාරයේ යෙදෙන සෑම තැනකම එම ස්වර අසලින් sharp හෝ flat සලකුණ යෙදීමෙනි. පහත ප්‍රස්තාරය අධ්‍යයනය කරන්න.

ම නි ධ | ම නි ම



01. Key signature එකෙන් හගවන්නේ කුමක් ද ?

02. Key signature යොදන ක්‍රම කීයද ඒවා මොනවා ද ?

03. Clef සංකේතය අසලින් key signature එක යොදන්නේ කුමන ක්‍රමයකට ද ?

04. අදාල ස්වරය අසලින් key signature එක යෙදීම හඳුන්වන්නේ කුමන නමකින් ද ?

05. F major Scale යේ key signature එක ලියා දක්වන්න .

06. G major Scale යේ key signature එක ලියා දක්වන්න.

07. මගරි- / ධනි - රි / ග රිනිම /

ඉහත ස්වර ප්‍රස්තාරය බටහිර ක්‍රමයට පරිවර්ථනය කරන්න.

08. ඉහත ස්වර ප්‍රස්තාරය අයත් Scale ය නම් කරන්න.

09. F Major Scale යට අයිති Key signature එක stave එක මත ලියා දක්වන්න.

10. සරිග- / ම- ගරි / ස - - - /

මෙම ස්වර ප්‍රස්තාරය අයිති Scale ය නම් කරන්න .

විෂය :- පෙරදිග සංගීතය | ශ්‍රේණිය :- 9 ශ්‍රේණිය

පාඩම/ඒකකය :- නව නාට්‍ය ගීත

ගුරුවරයාගේ නම :- එන්. කේ. ඩී. සුභද්‍රා කුමාරි | පාසල :- අම්/රජගලතැන්න මහා විද්‍යාලය

නව නාට්‍ය ගීතවල ආරම්භය සිදු වූයේ 1956 වර්ෂයේ එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාට්‍යයයෙනි. ඓතිහාසික පුරාවෘත්ත ආගමික, තොරතුරු එදිනෙදා සිද්ධි නාට්‍ය අනුසාරයෙන් නව නාට්‍ය වලින් නිර්මිතය.



එදිරිවීර සරච්චන්ද්‍රයන්

මනමේ නාට්‍යයේ දර්ශනයක්

නව නාට්‍යවලදී සංගීතයට ප්‍රධාන තැනක් හිමිවේ. සංගීතය නව නාට්‍ය සඳහා අත්‍යවශ්‍යය. එනම් නාට්‍යයක අවස්ථා හා ඊට උචිත පරිසරය මැවීම සඳහා නාට්‍ය අවස්ථා තිව්ර කිරීම සඳහා සංගීතය යොදා ගනී. මෙහි නළු නිළියන්ට ගීත ගැයීමේ හැකියාව අත්‍යවශ්‍යය.

නූතන නව නාට්‍ය ගීත බොහෝදුරට පැරණි නාට්‍ය ගීතවලට වඩා නාට්‍යෝචිත ස්වභාවයෙන් ඉවත්ව සරල ස්වභාවයක් ගනියි. ඇතැම් නව නාට්‍ය තනුවල තවමත් සාම්ප්‍රදායික නාඩගම් ඡායාවක් තිබේ.මෙහිදී ගායනය සමඟම රංගනය ද සිදු කරයි. ගීත අලංකරණය කිරීම සඳහා සංගීතය මඟින් introduction, bits භාවිතා කරයි.

නව නාට්‍යය ප්‍රභේද:-

ශෛලීගත හා අර්ධ ශෛලීගත ලෙස නව නාට්‍ය ප්‍රභේද දෙකකි.

- මනමේ, සිංහබාහු හා හුණුවටයේ කතාව ශෛලීගත නාට්‍යවලට උදාහරණ ලෙස දැක්විය හැකිය.
- අර්ධ ශෛලීගත නාට්‍ය ලෙස නරිබෑනා, බෙරහඬ හා මී පුර වැසියෝ නම් කළ හැකිය.

සිංහබාහු - ශෛලීගත නාට්‍යයකි



නරිබෑනා - අර්ධ ශෛලීගත නාට්‍යයකි

- ශෛලීගත නාට්‍යවලට අත්වැල් ගායක කණ්ඩායමක් සිටීම විශේෂ ලක්ෂණයකි.
- අර්ධ ශෛලීගත නාට්‍යවල ගීත එම චරිත විසින්ම ගායනා කරයි.

පහත සඳහන් වන්නේ නිර්දේශිත නව නාට්‍ය කිහිපයක් පිළිබඳ තොරතුරු වේ.

නව නාට්‍ය	නිර්මාණ දායකත්වය	අයත් ගීත	සංගීතය
හුණුවටයේ කතාව	හෙන්රි ජයසේන මහතා	හෙල ගැඹුරුයි යුද්දෙට මං ගියා	ෂෙල්ටන් ප්‍රේමරත්න මහතා
නරි බෑනා	දයානන්ද ගුණවර්ධන මහතා (රබන් පද ආශ්‍රිතව තනු නිර්මාණය කර ඇත)	ඇහැල මලින් කුමටද සොබනියේ	ලයනල් අල්ගම මහතා
බෙර හඬ	බන්දුල ජයවර්ධන මහතා	හනික වරෙව් කොල්ලනේ	ඔස්ටින් මුණසිංහ මහතා
නල දමයන්ති	චිත්‍රසේන මහතා	ඇත කඳුකර හිමව් අරණේ	පණ්ඩිත් ඩබ්ලිව් ඩී අමරදේව මහතා
දෙපානෝ (ගීත නාට්‍යයකි)	ඩබ්ලිව් බී මකුලොලුව මහතා	කොයි යන්නට එනවද බොල	ඩබ්ලිව් බී මකුලොලුව මහතා
ප්‍රේමතෝ ජායතී සෝකෝ (ගීත නාට්‍යයකි)	මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා	ඇඳුරුතුමා වන්න මගේ	ජයන්ත අරවින්ද මහතා
තාරාවෝ ඉගිලෙති	ලූෂන් බුලත්සිංහල මහතා	සෝබාව දේ කඩේට පලයන්	ගුණදාස කපුගේ මහතා



මුද්‍රා නාට්‍ය - මුද්‍රා වලින් පමණක් අදහස් ප්‍රකාශනය

- පෙරදිග
  - ලංකාව
    - කරදිය
    - නල දමයන්ති
- අපරදිග (BALLET) ඉතාලිය, ප්‍රංශය, රුසියාව
  - හංසවිල (SWAN LAKE) රුසියාව

නල දමයන්ති නාට්‍යයේ ගීතයක්

ඈත කඳුකර හිමව් අරණේ
සීත චන්දන ළපළු හෙවණේ
සුළං රැල්ලේ පාව එන්නේ
ඔහුගෙ නාමය වේ

සඳැල්ලේ මිණි තලාවේ
තාරකා පිපි වෙලාවේ
ළඳැලියන්ගේ සීන අතරේ
මැවෙයි ඒ රූපේ

ඈත කඳුකර..............

රනින් කල වන් පුළුල් උරයෙන්
හසුන් ළමැදේ මුසු කරන්නන්
හදේ මෝරන ආදරේ සඳේ සොමි ගුණ යා කෙරේ //
සරාගී නිල් නුවන් බඳුනින් නුරා ඉතිරෙන්නේ

නව නාට්‍ය නිර්මාණකරුවන්,

හෙන්රි ජයසේන මහතා


ලූෂන් බුලත්සිංහල මහතා

චිත්‍රසේන මහතා

මකුලොලුව මහතා

කාර්යය පත්‍රිකාව:-

1. නව නාට්‍ය සම්ප්‍රදායේ ලාංකික පුරෝගාමියා වනුයේ,

(i) එදිරිවීර සරච්චන්ද්‍ර ශූරීන් (ii) ජයලත් මනෝරත්න ශූරීන්
(iii) ලයනල් රන්වල ශූරීන් (iv) දයානන්ද ගුණවර්ධන ශූරීන්

2. කුමටද සොබනියෙ කඳුළු සලන්නේ ගීතය අයත් නාට්‍ය වනුයේ,

(i) හුණුවටය නාට්‍ය (ii) තාරාවෝ ඉගිලෙති නාට්‍ය
(iii) නරි බෑනා නාට්‍ය (iv) බෙර හඬ නාට්‍ය

3. ඇඳුරුතුමා වන්න මගේ ගීතය අයත් නාට්‍ය වනුයේ,

(i) දෙපානෝ නාට්‍ය (ii) බෙරහඬ නාට්‍ය
(iii) ප්‍රේමතෝ ජායතී සෝකෝ නාට්‍ය (iv) කුන්ඩලකේසී නාට්‍ය

4. දෙපානෝ නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

(i) ලූෂන් බුලත්සිංහල මහතා (ii) ඩබ්ලිව් ඩී අමරදේව මහතා
(iii) ඩබ්ලිව් බී මකුලොලුව මහතා (iv) බන්දුල ජයවර්ධන මහතා

5. ~~නල දමයන්ති නාට්‍ය සම්බන්ධ නොවන ශිල්පියකු වන්නේ,~~

(i) චිත්‍රසේනයන් (ii) ඩබ්ලිව් ඩී අමරදේවයන්
(iii) මහගම සේකරයන් (iv) දයානන්ද ගුණවර්ධන

හිස්තැනට සුදුසු පිළිතුර යොදා ඡේදය සම්පූර්ණ කරන්න.

ශ්‍රී ලංකාවේ නව නාට්‍ය සම්ප්‍රදාය (6)......................... වර්ෂයේ දී (7).................... මහතාගේ මනමේ නාට්‍යයෙන් ඇරඹිණි. එතැන් සිට නිර්මාණය වූ නාට්‍ය (8).................. හා අර්ධ ශෛලිගත වශයෙන් දෙයාකාර වේ. (9) .... නාට්‍ය වලට අත්වැල් ගායක කණ්ඩායමක් සිටින අතර (10) .... නාට්‍යවල ගීත එම චරිත විසින්ම ගායනා කරයි.

අංක 11-15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

11. අභිනය හා මුද්‍රා පමණක් උපයෝගී කරගනිමින් සංගීතය ප්‍රධාන කොට රඟ දක්වන නාට්‍ය විශේෂය කුමක්ද?
12. අර්ධ ශෛලීගත හා ශෛලිගත නාට්‍ය සඳහා උදාහරණ සපයන්න.
13. නව නාට්‍ය වල සංගීතමය ලක්ෂණ උදාහරණ සපයමින් විස්තර කරන්න.
14. ඔබ උගත් නව නාට්‍ය ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර ගත කරන්න.
15. ඉහත වගුවේ ඇතුලත් නොවූ නව නාට්‍ය පහක් නම් කරන්න.

විෂයය - පෙරදිග සංගීතය ශ්‍රේණිය - 09

පාඩම / ඒකකය - වන්නම්

ගුරුවරයාගේ නම - එස් . ඩී. දම්මි ප්‍රියංකා රාජපක්ෂ (කලාප අධ්‍යාපන කාර්යාලය)

කියවීම් පත්‍රිකාව

වන්නම්

- ජන ගී වර්ගීකරණයට අනුව සේ ගී ගණයට අයත් වේ.
- උඩරට , පහතරට , සබරගමු ලෙස ප්‍රාදේශීය වශයෙන් වර්ග වේ.
- වර්ණනාව යන අර්ථය දේ.
- දෙවියන් , සතුන් , සිද්ධි හා වෙනත් වස්තූන් පිළිබඳ වර්ණනා ඇතුලත් වේ.
- උඩරට , පහතරට , සබරගමු සම්ප්‍රදායන්හි ප්‍රධාන ශාන්තිකර්මයන් පිළිවෙලින් කොහොඹා කංකාරිය, දෙවොල් මඩු ශාන්තිකර්මය හා පහන් මඩු ශාන්තිකර්මය වේ.

උඩරට නර්තන සම්ප්‍රදාය



උඩරට වෙස් නර්තනය

ගැටබෙර වාදකයෙක්



ගැට බෙරය



කොහොඹා කංකාරිය

පහතරට නර්තන සම්ප්‍රදාය

පහතරට බෙර වාදකයෙක්

පහතරට නර්තන ශිල්පියෙක්



දෙවොල් මඩු ශාන්ති කර්මය

සබරගමු නර්තන සම්ප්‍රදාය



සබරගමු නර්තන ශිල්පියෙක්



සබරගමු නර්තනයක්

දවුල් වාදකයෙක්



පහන් මඩු ශාන්ති කර්මය

	ආරම්භය හා දායකත්වය	ප්‍රචලිත ප්‍රදේශ	ප්‍රධාන අවනද්ධ භාණ්ඩය	වන්නමේ කොටස්	වන්නම් සංඛ්‍යාව	වන්නමේ නම
උඩරට වන්නම්	❖ මහනුවර යුගයේ ❖ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජ සමය ❖ කවිකාර මඩුවේ සේවය කළ කර්ණාට සංගීතඥ ගණිතාලංකාර විසින් තනු නිර්මාණය කිරීම	සත්කෝරළය සතර කෝරළය බදුල්ල උඩු නුවර යටි නුවර හඟුරන්කෙත	ගැටබෙරය	6 කි බෙර පදය තානම කවිය කස්තිරම සීරු මාරුව අඩව්ව	18	හනුමා ගජගා මයුරා තුරඟා
පහතරට වන්නම් (සින්දු වන්නම්)	❖ දඹදෙණි යුගයේ ❖ කලිකාල සර්වඥ පණ්ඩිත 2 වන පරාක්‍රම බාහු රජ සමයේ විෂ්ණු දෙවියන් උදෙසා රචනා කර තිබේ.	ගාල්ල මාතර අම්බලන්ගොඩ බෙන්තර	යක් බෙරය	4 කි බෙර පදය තානම කවිය ඉරට්ටිය	32	කොණ්ඩනාච්චි තාලය විශ්ණු තාලය නළු ගීතිකා තාලය
සබරගමු වන්නම්	❖ කලවානේ ධර්මාලංකාර අතපත්තු මුදලි විසින් සංස්කරණය කොට ඇත.	රත්නපුරය කලවාන කුරුවිට පැල්මඩුල්ල නිවිතිගල	දවුල	5 කි දවුල් පදය තානම කවිය කලාසම අඩව්ව	නාමිකව 24 කි භාවිතයේ 18 කි	තිසරා කෝකිල ගාහක අනිලා මණ්ඩුක

උකුසා වන්නම

- ❖ උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වේ.
- ❖ මෙම වන්නමෙන් උකුස්සකුගේ චර්යා රටා විස්තර වේ.
- ❖ මහ තනිතිතට අනුව නිර්මාණය වී ඇත.
- ❖ තානමේ නාදමාලාව අනුව කවිය ගායනය වේ.

බෙර පදය	දො දො ම් දො	මි ත දො ම්	දො මි කි ත	කි ත දො ම්

තානම

ස - ප -	- - ධ ප	ම ධ ප ම	ගු රි ස නි
තා S නා S	S S S S	S S S S	S S S S
ස රි ගු ම	ගු රි ගු රි	ස - - -	- - - -
තා S නෙ S	න S තා S	න ම් S S	S S S S
මෝ S රා S	S S S S	S S S S	S S S S
බී S S S	ජ S යෙ S	නා S S S	S S S S

කවිය - මෝරා බීජයෙනා //
කළපත් දෙකඩත් කළසිත් තුටුවෙත්
දෙන්නා අදර තොසා

නැරා තටුපතිනා //
ලෙලවත් සොලවත් පියඹත් නදදෙත්
යන්නා පවන රැසා

සාරා බොජුන යෙනා //
අයිරත් පෙතියොත් තුඩගත් බුදිසිත්
පැන්නා එජල රැසා

නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න

1) වන්නම් උඩරට .... සබරගමු ලෙස ප්‍රාදේශීය වශයෙන් වර්ග තුනකි.
2) ජන ගී වර්ගීකරණය අනුව වන්නම් .... ගණයට අයත් වේ.
3) වන්නම් සඳහා තනු නිර්මාණයේදී කර්ණාට සංගීතඥ .... විසින් දායක වී ඇත.
4) සබරගමු නර්තනයේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය .... යි.
5) උඩරට වන්නම් ගණන .... කි.

නිවැරදි පිළිතුර තෝරන්න

6) .සබරගමු වන්නමකි
 1. මයුරා 11. ගජගා 111. අනිලා 1V. නළු ගීතිකා තාලය
7) උකුසා වන්නම ගැයෙන තිත වන්නේ
 1. සුළු තනි තිත 11. මැදුම් තනි තිත 111. මහ තනි තිත 1V. සුළු මහ දෙතිත
8) බෙර පදය , තානම , කවිය .... යන කොටස් පහතරට වන්නමක කොටස් වේ.
 1. කලාසම 11. ඉරට්ටිය 111. අඩච්ච 1V. කස්තිරම
9) උඩරට වන්නම් සඳහා යොදා ගන්නා අවනද්ධ භාණ්ඩය
 1. යක් බෙරය 11. දවුල 111. ගැට බෙරය 1V. දෙවොල් බෙරය
10) පහතරට සම්ප්‍රධාය අයත් වන්නම් ගණන
 1. 18 කි 11. 24 කි 111. 28 කි 1V. 32 කි

පිළිතුරු සපයන්න

11) " වන්නම් " යන්න කෙටියෙන් හඳුන්වන්න.
12) පහතරට වන්නම් හඳුන්වන වෙනත් නාමයක් සඳහන් කර එම වන්නම් රචකයාගේ නම ලියන්න
13) සත් කෝරළය , සතර කෝරළය , බදුල්ල යන ප්‍රදේශ වල ප්‍රචලිත වන්නම් විශේෂය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.
14) මහ තනි තිතට ගැයෙන වෙනත් ජන ගී දෙකක් ලියන්න.
15) විතතාතත භාණ්ඩය ප්‍රධාන අවනද්ධ භාණ්ඩය ලෙස ගැනෙන නර්තන සම්ප්‍රදාය නම් කර එහි විස්තර කෙටියෙන් සඳහන් කරන්න

විෂය -: සංගීතය ශ්‍රේණිය -: 9 ශ්‍රේණිය

පාඩම / ඒකකය -: ප්‍රශස්ති ගී පිළිබඳ සංස්කෘතික පසුබිම

ගුරුවරයාගේ නම -: **A.** සේපාලිකා ප්‍රියදර්ශනී පාසල -: අම්/ගාමිණී මහ විද්‍යාලය

ප්‍රශස්ති ආරම්භය -:

මහනුවර යුගයේශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජ සමයේ කවිකාර මඩුව ආශ්‍රිතව ආරම්භ වී ඇත

ප්‍රශස්ති ග්‍රන්ථ -:

පවන
රාජ සිංහ වැනුම
ශ්‍රී නාමය
ශෘංගාලංකාරය
ඇහැලේපොළ වැනුම
නරේන්ද්‍රසිංහ වැනුම
ශ්‍රී වික්‍රමාලංකාරය
පැරකුම්බා සිරිත
(පැරණිම ප්‍රශස්ථ කාව්‍ය)

ප්‍රශස්ති යනු -:

රාජ රාජ මහාමාත්‍යාදීන් සහ ජනප්‍රවාදයට පත් ප්‍රභූන්ගේ වීර වික්‍රමාන්විත ක්‍රියා ඉසුරුමත් බව ත්‍යාගශීලී බව පෞරුෂය ලක්ෂණ වැනි ගති ස්වාභාවයන් ඉස්මතු කිරීමකි.

ප්‍රශස්ති කථානායකයන් -:

කෝට්ටේ ශ්‍රී පරාක්‍රමබාහු රජතුමා
පළමුවැනි රාජසිංහ රජතුමා
සෙනරත් රජතුමා
දෙවන රාජසිංහ රජතුමා
ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා
ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා

ප්‍රශස්ති කතුවරුන්

ඌවේ කුඩා මොහොට්ටාල
(රාජසිංහ වර්ණනාව)
රම්මොලක අදිකාරම
(නරේන්ද්‍රසිංහ වර්ණනාව)
දස්කොන් අදිකාරම
(ශෘංගාලංකාරය)
පාළුවැවේ ධම්මානන්ද හිමි (ශ්‍රී වික්‍රමාලංකාරය)

ප්‍රශස්ති වර්ග -:

- ❖ දේව ප්‍රශස්ති
- ❖ රාජ ප්‍රශස්ති
- ❖ භූත ප්‍රශස්ති
- ❖ බුද්ධ ප්‍රශස්ති

යොදාගත් සංගීත භාණ්ඩ -:



සුවිශේෂී ලක්ෂණ -:

- ❖ සේ ගී ගණයට අයත් වේ.
- ❖ කර්ණාටක සංගීතයේ ආභාෂය ලැබී ඇත.

  උදාහරණ : දකුණු ඉන්දියානු සංගීතඥයන්
- ❖ කවිකාර මඩුවේ සේවය කර ඇත. උදාහරණ: ගණිතාලංකාර , නාරසිංහ ,අගලනායිදූ
- ❖ ගීතයේ නිතර නිතර ගැයෙන පාදය මුදුන් පාදය/මුදුප්පදය වේ.
- ❖ ප්‍රශස්ති ගායකයන් වන්දිභට්ටයන් ලෙස හඳුන්වා ඇත. ඔවුන් පසකුත් යන නමින්ද හඳුන්වයි.
- ❖ සක් පිඹින්නන් යකදුරන් නමින් හඳුන්වා ඇත.
- ❖ මෙම ගීත වල අර්ථ රසයට වඩා ප්‍රමුඛත්වයක් ලබාදී ඇත්තේ ශබ්ද රසයට යි.
- ❖ ද්‍රවිඩ, තෙලිඟු මිශ්‍ර බස් වහරක් යොදා ගෙන ඇත.
- ❖ බහුපාද කාව්‍ය සැලසුමක් දක්නට ලැබේ.
- ❖ සප්තක තුනෙහිම විහිදෙන පුළුල් ස්වර ක්ෂේත්‍රයක් ඇත.
- ❖ ප්‍රශස්ති ගී වල මැද හෝ අග ස්ථානයන්හි අවනද්ධ පද යොදා අලංකාර කොට ඇත. ඒ සඳහා බෙර පද ඇතුළත් ව ඇත.

➤ **ප්‍රශස්ති ගීත සඳහා උදාහරණ ලෙස -:**

- ❖ වරමාති සුභ චරිතේ
- ❖ ලක්ෂ්මී ... බුජ වාසා
- ❖ චන්දනම් යස තේජ කුංකුම
- ❖ තුරු රත්න සිරි ලෙසිනා යන ගීත පෙන්වා දිය හැක

➢ ප්‍රශස්ති ගීත ගැයූ ස්ථාන හා ගායක කණ්ඩායම්





➢ පහත සඳහන් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ප්‍රශස්ති ගී ගායනා කරනු ලැබුවේ කාගේ ගුණ වර්ණනා කිරීමට ද?
I රාජ බිසෝවරුන්ගේ II රජවරුන්ගේ III වන්දි භට්ටයින්ගේ IV රටවැසියන්ගේ

02. ප්‍රශස්ති ගී සඳහා තනු නොසැපයූ සංගීතඥයෙකි.

I.පිළිප්පු සිංඤෝ II. නාරසිංහ III. අලගකායිදු IV. ගණිතාලංකාර

03. මෙම ගීත වර්ගය ආරම්භ වූයේ කිනම් යුගයකදී ද?

I. දඹදෙනි යුගය II. කෝට්ටේ යුගය III. මහනුවර යුගය IV. සීතාවක යුගය

04. ප්‍රශස්ති ගීතයක් නොවන්නේ මින් කුමක්ද?

I. ලක්ෂ්මි බුජවාසා II. වන්දනම් යස III. තුරු රත්න IV. තෙදිනි විරාජ

05. මෙම ගීත අයත් වන්නේ

I. ගැමි ගී ගණයට II. සේ ගී ගණයට III. ජන ගී ගණයට IV.සමාජ ගී ගණයට

➢ පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. ප්‍රශස්ති ගී සඳහා .... සංගීතයේ ආභාෂය ලැබී ඇත.
2. සමහර ප්‍රශස්ති ගීත වල .... යන විශේෂ කොටස අඩංගු වේ.
3. රාජවාසල හා සම්බන්ධ .... ආශ්‍රිතව මෙම ගීත නිර්මාණය වී ඇත.
4. ප්‍රශස්ති ගීත වල භාෂාව ....
5. ප්‍රශස්ති ගීත වල .... මුල් තැන ලබා දෙමින් ගීත නිර්මාණය වී ඇත.

➢ පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

01. ප්‍රශස්ති ගීත යනු මොනවාදැයි විස්තර කරන්න.

02. ප්‍රශස්ති ගීත සඳහා යොදාගත් සංගීත භාණ්ඩ මොනවාද?

03. ප්‍රශස්ති ගී ඇතුළත් ග්‍රන්ථ පහක් නම් කරන්න.

04. ප්‍රශස්ති ගීත වල ඇති සුවිශේෂී ලක්ෂණ මොනවාද ?

05. ඔබ දන්නා ප්‍රශස්ති ගීතයක කොටසක් ලියන්න.

විෂය -: සංගීතය　　　　　　　　　　　　　　　ශ්‍රේණිය -: 9 ශ්‍රේණිය

පාඩම / ඒකකය -: හටන් ගී පිළිබඳ සංස්කෘතික පසුබිම

ගුරුවරයාගේ නම -: **A.** සේපාලිකා ප්‍රියදර්ශනී　　　　පාසල -: **අම්/ගාමිණී මහ විද්‍යාලය**

"හටන් වලදී රජතුමා, මැති ඇමැතිවරුන් කරන ලද පරිශ්‍රමයන් , ජයග්‍රහණයන් වර්ණනා කරමින් හටන පිළිබඳව උපකල්පනය කර ලියන ලද ගී "හටන් ගී" ලෙස හඳුන්වයි.

හටන් ගී ⟶ මහනුවර යුගයේ ප්‍රචලිත වූ ගීත විශේෂයකි.

⟶ සේ ගීත ගණයට අයත් වේ.

⟶ ද්‍රවිඩ සාහිත්‍යයේ "පරනි" කාව්‍ය ඇසුරින් සිංහලයට එක් වූ සාහිත්‍ය අංගයකි. මෙහි විශේෂ ලක්ෂණයක් වන්නේ යුද්ධයකින් පසුව නායකයාගේ ගුණ වැයීම

⟶ "අලගියවන්න මුකවෙටි" විසින් ප්‍රධාන ග්‍රන්ථ 3ක් රචනා කර ඇත. (කුන්ස්තන්තීනු හටන, පරංගි හටන, මහ හටන)

හටන් ගීත වලට උදාහරණ : යුද්දෙටත් ඇවිත් සිදූ පිට නැව් නැගලා පරංගි

කපන කොටන බිම පෙරලන

නොමදින් විකුම් පාලා



භාෂාව හා සංගීතමය ලක්ෂණ -:

- සරල මෙන් ම සංකීර්ණ බස ද දැකිය හැක.
- නාද රටා සප්තක කීපයක් ඇසුරින් නිර්මාණය වී ඇත.
- නාද රටා වලින් වීරත්වය ප්‍රකාශ කරයි.
- මාත්‍රා 3/ 4 රිද්මය බහුලව යෙදෙන අතර මාත්‍රා තුනෙන් තුන හතරෙන් හතර හා 2/3 , 2/4 අනුව ද ගීත නිර්මාණය වී ඇත.
- ආසාතාත්මක ගීත විශේෂයක් බැවින් සමූහ ගායනයට සුදුසු ය.

මෙම සංගීත භාණ්ඩ යොදා ගනී





➢ පහත සඳහන් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. "හටන් ගී" නිර්මාණය වූයේ කුමන යුගයේද?
I මහ නුවර II. කෝට්ටේ III. සීතාවක IV. දඹදෙණි

02. හටන් ගී වලින් කියැවෙන්නේ
I දුක ගැනය II විඩාව ගැනය III වීරත්වය ගැන ය IV පරාජය ගැනය

03. හටන් ගීතයකට උදාහරණයක් නොවන්නේ
I යුද්දෙට මං ගියා II කපන කොටන III නොමදින් විකුම් පාලා IV යුද්දෙටත් ඇවිත්

04. කුන්ස්තන්තීනු , පරංගි, මහ හටන රචනා කලේ
I ශ්‍රී වික්‍රම රාජසිංහ II නරේන්ද්‍ර සිංහ III ඇහලේ පොළ IV අලගියවන්න මුකවෙටි

05. හටන් ගීත
I අනාසාතාත්මක II ආසාතාත්මක III තාල රහිතය IV විලම්භ ලයෙන් ගැයේ

➢ පහත සඳහන් කියමන් හරිනම් (✓) ලකුණද ද වැරදි නම් (X) ලකුණු ද යොදන්න.

1. හටන් ගී සේ ගී ගණයට අයත් නොවේ ( )
2. උච්ච සප්තකය පමණක් ඇසුරු කරගෙන හටන් ගීත නිර්මාණය වී ඇත ( )
3. ගීත සඳහා යොදා ගෙන ඇති භාෂාව සරල මෙන්ම සංකීර්ණ ද වේ ( )
4. සමූහ ගායනයට සුදුසු වේ ( )
5. සටනේ දී ලැබූ ජයග්‍රහණයන් වර්ණනා කරමින් හටන් ගීත ගායනා කර ඇත ( )

➢ පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

01. හටන් ගී වලට නිර්වචනයක් ලියන්න.
02. හටන් ගීත වල සුවිශේෂී ලක්ෂණ මොනවාද?
03. හටන් ගී වල සංගීතමය ලක්ෂණ මොනවාද?
04. හටන් ගී සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩ මොනවාද?
05. ඔබ අසා ඇති හටන් ගියක් සම්පූර්ණයෙන් ලියන්න.

විෂයය - පෙරදිග සංගීතය	ශ්‍රේණිය - 09
පාඩම / ඒකකය - පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණය	
ගුරුවරයාගේ නම - එස් . ඩී. නිම්මි චතුරිකා රාජපක්ෂ	පාසල - අම් / සීවලී විද්‍යාලය

❖ **පංචතූර්ය වාදනයේ ඓතිහාසික තොරතුරු -:**

- ➢ අනුරාධපුර යුගයේ සිට ශ්‍රී ලංකාවේ පැවත එන විශේෂ වාදන අංගයකි.
- ➢ දුටුගැමුණු රජතුමාගේ බළකායේ විශාල පිරිසක් විසින් පංචතූර්ය වාදනය කරන ලදි.

❖ **පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණය පහත පරිදි**



❖ **ඒ අනුව එම කොටස් 5**

- **ආතත භාණ්ඩ**

  අතින් පමණක් වාදනය කරනු ලබන භාණ්ඩ මේ ගණයට අයත් වේ.

ගැටබෙරය

- ▪ උඩරට බෙරය හෙවත් ගැටබෙරය දීර්ඝ කාලයක සිට ලංකාවේ වාදනය කරන භාණ්ඩ අතර ප්‍රමුඛ වේ.
- ▪ ගැටබෙරයේ දිග අඟල් 28 ක් පමණ වේ.
- ▪ ගැටබෙරයේ කඳ සඳහා අරටුව සහිත දැව වර්ග යොදා ගැනේ.
- ▪ බෙරයේ වම්පස මුහුණට වඩා දකුණුපස මුහුණත ප්‍රමාණයෙන් තරමක් කුඩා වන සේ සකස් කරයි.
- ▪ වම්පස බෙර ඇසට සන වූ හරක් හම ද , දකුණුපස බෙර ඇසට වඳුරු හමක් හෝ තලගොයි හමක් යොදා ගැනේ.



යක් බෙරය

- පහතරට නර්තන සම්ප්‍රදාය හා බැඳි ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ.
- රුහුණු බෙරය, දික් බෙරය, බොකු බෙරය, සෝෂක බෙරය ආදි නම් වලින් හැඳින්වේ.
- මෙහි හැඩය සිලින්ඩරාකාරය.
- බෙර කඳ සකස් කර ඇත්තේ කිතුල් , පොල් , ඇහැළ , මිල්ල, කොහොඹ යන දැව වලිනි.
- මෙම යක් බෙරය දේව තොවිල් , යක් තොවිල් , බලි තොවිල් යන යාතු කර්ම තුනේදීම යොදා ගැනේ.
- බෙරයේ වම් පැත්ත සුරල් පැත්ත වන අතර , දකුණු පැත්ත හයි ගහන පැත්ත යන පාරිභාෂික වචනයෙන් හඳුන්වයි.
- හයි පැත්තට තරමක් ඝනකමින් යුත් හරක් හමද , සුරල් පැත්තට මදක් තුනී හමක් ද යොදා ගනු ලැබේ.



- **විතත භාණ්ඩ**
  - කඩිප්පුවකින් නැතහොත් කෝටුවකින් වයන භාණ්ඩ විතත වේ.

තම්මැට්ටම

- හේවිසි වාදනයේදී ප්‍රධාන වාද්‍ය භාණ්ඩය තම්මැට්ටමයි
- කඩිප්පු දෙකක් යොදා ගෙන වාදනය කරයි.
- බෞද්ධ සිද්ධස්ථානයන්හි පොහෝ දින හේවිසි මුර වාදනයේදීත් , ගමන් හේවිසි සඳහාත් , අවමංගල බෙර වාදන සඳහාත් තම්මැට්ටම වාදනය කරයි.
- මෙම භාණ්ඩයේ වම් ඇසෙහි ශබ්ද ධ්වනිය ඉතා පහත්ව නැගෙන සේ ඝන වූ සමෙන් නිමවා ඇත. දකුණු ඇසෙහි ශබ්දය ඉතා උස්ව නැගෙන සේ තුනී සමකින් නිපදවා ඇත.
- ඇහැළ , කොහොඹ , කොස් යන දැව වර්ග වලින් කඳ සකස් කර ඇත.
- දකුණු හා වම් ඇස් සඳහා හරක් හම් හා මුව හම් යොදා ගෙන ඇත.



- **විතතාතත භාණ්ඩ**

  අත් සහ කෝටුව යන දෙකම යොදාගෙන වයනු ලබන භාණ්ඩයි.

දවුල

- දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන භාණ්ඩයක් ලෙස දවුල හැඳින්විය හැක.
- වැඩවසම් සමාජ ක්‍රමයේ දී අණබෙරයක් ලෙස දවුල භාවිතා කරන ලදි. එබැවින් මෙම දවුල් වාදනය සන්නිවේදන මාධ්‍යයක් ලෙස භාවිතා වී ඇත.
- මහනුවර දළදා පෙරහැරේ උඩරට දවුල් වාදනයට විශේෂ තැනක් හිමි වේ.
- සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ.
- ව්‍යවහාරික සංගීතයේදී ද ඇතැම් අවස්ථා වල මෙම භාණ්ඩය භාවිතා කරයි.
- වාදනයේදී තියුණු හඬ විහිදෙන පැත්තට කඩිප්පුව යොදා ගන්නා අතර , ගැඹුරු හඬ විහිදෙන පැත්ත අතින් වාදනය කෙරේ.
- බෞද්ධ වෙහෙර විහාර හා ආගමික චාරිත්‍ර , තේවා කටයුතු සඳහාද , දේවාලය හා බැදි පුද පූජා වතාවත් සඳහා ද , මංගල හා අවමංගල අවස්ථා වලදී ද භාවිතා කරයි.
- ඇහැළ , කොහොඹ , ගංසූරිය , වරකා , කිතුල් යන වටිනා දැව වර්ග වලින් දවුල් කඳ සකස් කරයි
- කඳ ලියවා පිත්තල පටි අල්ලා අලංකාර කිරීම පැරණි ක්‍රමයකි.
- කඳෙහි දිග අඟල් 18 ත් 20 ත් අතර ප්‍රමාණයකි. වාදනය සඳහා කඩිප්පුවක් යොදා ගනී.



- **ඝණ භාණ්ඩ**
  ලී , ලෝහ වැනි ඝන ද්‍රව්‍ය වලින් සැකසුණු තැලීමෙන් හඬ උපදවන භාණ්ඩයි.

- **සුෂිර භාණ්ඩ**
  පිඹීමෙන් හඬ උපදවා වයන භාණ්ඩයි

නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න

1) යක්බෙරයෙහි හැඩය .... වේ.
2) හේවිසි වාදනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය .... වේ .
3) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය .... යි.
4) ආනත භාණ්ඩ යටතට ගැනෙන්නේ ගැටබෙරය හා .... යි.
5) යක්බෙරය .... යක් තොවිල් , ... යන ශාන්ති කර්ම තුනේදීම යෙදේ.

නිවැරදි පිළිතුර තෝරන්න

6) . අත සහ කෝටුව භාවිතා කර වයන භාණ්ඩය වන්නේ
   1 ගැටබෙරය   11. දවුල   111. යක්බෙරය   1V. තම්මැට්ටම
7) යක්බෙරය අයත් වන නර්තන සම්ප්‍රදාය වන්නේ
   1. සබරගමු   11. උඩරට   111. පහතරට   1V. මේ කිසිවක් නොවේ.
8) ආගමික පුද පූජා ඇතුළත් අනිවාර්ය අංගයකි.
   1. දවුල් වාදනය   11. හේවිසි වාදනය   111. බෙර වාදනය   1V. තම්මැට්ටම් වාදනය
9) ගැටබෙරයේ දිග ප්‍රමාණය වන්නේ
   1. අඟල් 16 කි   11. අඟල් 24 කි   111. අඟල් 28 කි   1V. අඟල් 32 කි.
10) කඩිප්පු දෙකක් යොදාගෙන වාදනය කරන වාද්‍ය භාණ්ඩය වන්නේ
   1. තම්මැට්ටම   11. දවුල   111. ගැටබෙරය   1V. යක්බෙරය

පිළිතුරු සපයන්න

11) වැඩවසම් සමාජ ක්‍රමයේදී යොදාගත් දේශීය වාද්‍ය භාණ්ඩය කුමක්ද? ඒ කුමක් සඳහාද ?
12) හේවිසි වාදනය සඳහා යොදා ගන්නා භාණ්ඩය නම් කරන්න
13) තම්මැට්ටම වාදනය කරන ප්‍රධාන අවස්ථා මොනවාද ?
14) දවුල , ගැටබෙරය , තම්මැට්ටම , යක්බෙරය යන වාද්‍ය භාණ්ඩවල කඳ කොටස සකස් කිරීමට ගන්නා දැව වර්ග මොනවාද ?
15) ඉහත සඳහන් භාණ්ඩ අතරින් එක් භාණ්ඩයක රූප සටහන ඇඳ කොටස් නම් කරන්න

විෂය :- පෙරදිග සංගීතය ශ්‍රේණිය 9
පාඩම /ඒකකය :- සංගීත ප්‍රසංගයකදී භාවිතාවන තාක්ෂණික මෙවලම්
ගුරුවරයාගේ නම :- එන් එම් අමිල එරංග සුගතදාස පාසල :- අම්/උහන ජාතික පාසල

- ➢ මිනිස් කටහඬ ඇසෙන දුර ප්‍රමාණය සීමිතය.
- ➢ එමනිසා එය ඈතට ඇසීමට නම් ස්පීකරය අවශ්‍යවේ.
- ➢ මිනිස් කටහඬක් හෝ සංගීත භාණ්ඩ වාදනයක් ස්පීකරය වෙත යාමට පෙර තවත් තාක්ෂණික මෙවලම් කීපයක ආධාරය අවශ්‍යවේ.
- ➢ මිනිස් කටහඬ හෝ සංගීත භාණ්ඩ වාදනය ග්‍රහණය කරගත හැකි තාක්ෂණික මෙවලමක් අවශ්‍යවේ එයට **මයික්‍රෆෝන** යැයි කියනු ලැබේ.

මයික්‍රෆෝන

- මයික්‍රෆෝන වර්ග රාශියක් වෙළඳපොළේ දක්නට ලැබේ.
- ඉන් ප්‍රධාන වශයෙන් වර්ග 02කි.
  - I. ඩයනමික් මයික්‍රෆෝන
  - II. කන්ඩෙන්සර් මයික්‍රෆෝන

ඩයනමික් මයික්‍රෆෝන් යනු සජීවී ප්‍රසංගවල බහුලව දක්නට ලැබෙන උපකරණයකි පාසලේ උදය රැස්වීම, පන්සලේ ධර්ම දේශනා කටයුතු සඳහා මෙය භාවිතා කරන ආකාරය දැක ගත හැකිය.
කන්ඩෙන්සර් මයික්‍රෆෝන ශබ්දාගාර වල ගිතයත් ගායනය හෝ වාදනය කර රෙකෝඩ් කර ගැනීම සඳහා භාවිතා කරයි මීලෙන් අධික මෙහි හඬ ග්‍රහණය කර ගැනීමේ ධාරිතාව ද වැඩිය.

ඇම්ප්ලිෆයර්

- මයික්‍රෆෝනයෙන් ග්‍රහණය කර ගන්නා හඬ වර්ධනය කර යවන්නේ ඇම්ප්ලිෆයර් එක හරහාය මෙයට ඇම්ප්(AMP) යනුවෙන්ද සමහරු භාවිතා කරයි 100 w 1000w,2500w,4500w ආදී වශයෙන් දැකගත හැකිය .
- මෙහිදී සිදුවන්නේ කොපමණ ප්‍රමාණයක් හඬ වැඩි කර යවන්නේ ද යන්න තීරණය කිරීමයි.




බෆල්

- මෙහිදී සිදුකරනු ලබන්නේ ඇම්ප් එක හරහා එනු ලබන signal එක බෆල් වෙත මුදා හැරීමයි බෆල් එකෙහි ඇති ස්පීකරයෙන් ශබ්ද තරංගයක් ලෙස එළියට විසුරුවා හරියි එවිට අපට ශ්‍රවණය වේ අඟල් 5 8 12 18 ආදී වශයෙන් සපීකර් දක්නට ලැබේ.

බෆල්



ස්පීකර්

මික්සර්(MIXER)

- මික්සින් කොන්සෝල් (MIXING CONSOLE) වන මෙය මික්සර් ලෙස කෙටියෙන් හඳුන්වයි.
- මයික්‍රෆෝන හා සංගීත භාණ්ඩ වල වයර් සම්බන්ධ කරන්නේ මෙයටය.
- මයික්‍රෆෝන හා ඉලෙක්ට්‍රික් සංගීත භාණ්ඩවලින් ග්‍රහණය කරගන්නා හඬ අඩු වැඩිකොට අලංකාර කිරීමක් ද මෙමගින් සිදු කළ හැක උදා:- Effect භාවිතය (Delay,Echo) .



- ➢ හඬෙහි ගුණාත්මක භාවය වැඩි කර ගැනීම සඳහා මයික්‍රෆෝන් ,ඇම්ප්ලිෆයර්, බෆල්, මික්සර් වලට අමතරව කේබල්ස්, හෙඩ්ෆෝන්, ගිටාර් පිකප් වැනි දෑ භාවිතා කරයි.
- ➢ සංගීතමය නාද නිපදවීම සඳහා තාක්ෂණික උපකරණ ලෙස ඉලෙක්ට්‍රික් ගිටාර් විදුලි ඕගනය ඔක්ටපෑඩ් ඉලෙක්ට්‍රික් ඩ්‍රම්ස් ආදිය භාවිතා කරයි .



කේබල්ස්

හෙඩ්ෆෝන්



ගිටාර් පිකප්

විදුලි ඕගනය



ඔක්ටපෑඩ්



01 සිට 05 දක්වා ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරැදි පිළිතුර යටින් ඉරක් අඳින්න

01 මයික්‍රෆෝනයකින් සිදුවන කාර්යභාරය වන්නේ

1ශ හඬ අලංකාරවත් කිරීම	2 ශබ්ද තරංගයක් ලෙස පරිසරයට මුදා කිරීම

3 හඬ ග්‍රහණය කිරීම	4 හඬ වර්ධනය කිරීම

02 එදිනෙදා ජීවිතයේ දී බහුලව දක්නට ලැබෙන මයික්‍රෆෝන වර්ගයකි

1 කන්ඩෙන්සර් මයික්‍රෆෝන	2 ඩයනමික් මයික්‍රෆෝන	3 රිබන් මයික්‍රෆෝන	4 FM මයික්‍රෆෝන

03 ග්‍රහණය කර ගන්නා හඬ වර්ධනය කිරීම සඳහා භාවිතා කරනු ලබන තාක්ෂණික උපකරණයකි

1 ඇම්ප්ලිෆයර්	2 මයික්‍රෆෝන	3 බෆල්	4 Audio Cable

04 මික්සර්(MIXER) එක භාවිතා කරනු ලබන්නේ

1 මයික්‍රෆෝන වයර් සම්බන්ධ කිරීම සඳහා
2 හඬ අලංකරණය කිරීම සඳහා
3 සංගීත භාණ්ඩ සම්බන්ධ කිරීම සඳහා
4 මේ සියල්ලන්ටම

05 හඬ අඩු වැඩි කිරීම සඳහාත් EFFECT භවිතය සඳහාත් යොදා ගනු ලබන්නේ

1 බෆල්	2 මයික්‍රෆෝනය	3 MIXER	4 AMP

06 සිට 10 දක්වා හිස්තැන් පුරවන්න

06 ශබ්දාගාර වල ගිත රෙකෝඩින් කර ගැනීම සඳහා ....භාවිතා කරයි.

07 මිනිස් කටහඬක් හෝ සංගීත භාණ්ඩ වාදනයක් බෆල් එකක ස්පීකරය හරහා .... ලෙසින් පරිසරයට මුදා හැරේ.

08 විවිධ ධාරිතාවයන්ගෙන් යුත් හඬ වර්ධනය කර ගැනීමට ඇති උපකරණය .... නමින් හඳුන්වයි.

09 මයික්‍රෆෝන.. හා .... වශයෙන් කොටස් දෙකකි .

10 හඬෙහි ගුණාත්මක භාවය වැඩිකර ගැනීම සඳහා ....භාවිතා කරයි.

11 සිට 15 දක්වා ප්‍රශණ වලට පිළිතුරු සපයන්න

11 මිනිස් කටහඬක් හෝ සංගීත භාණ්ඩ වාදනයක හඬ ග්‍රහණය කර ගන්නා තැනේ සිට අපට ඇසීම දක්වා එන ක්‍රියාදාමය ගැලීම් සටහනක් අයුරින් දක්වන්න.

12 ඩයනමික් මයික්‍රෆෝන භාවිතා කරන අවස්ථා 03ක් ලියන්න.

13 සංගීතය හදාරන අපට මික්සර් එකක වැදගත්කම කරුණු 02න් ලියා දක්වන්න.

14 සංගීතමය නාද නිපදවීම සඳහා නිර්මාණය තාක්ෂණික මෙවලම් 02 නම් ලියන්න.

15 සංගීතය කෙරෙහි තාක්ෂණික මෙවලම් වල ඇති අවශ්‍යතාවය කෙටියෙන් විස්තර කරන්න.




Aux1
Stage Monitors
Aux2
Aux Out
Power Amp
Gain
EQ
Aux
Mains
Main Out
Power Amp
Mains House
8chords100songs.com